සැ. යු. - 2009.10.09 දින පළ වූ අංක 1,623 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,624 - 2009 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා - 2009.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1588 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1589 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1593 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1587 - B 080058— 8,860 (2009/10)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහාධිකරණය - හලාවත

### රාජසන්තක කරන ලද ත්‍රිරෝද රථ දෙකක් විකිණීම

හලාවත මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන, මාරවිල දිසා මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද ත්‍රිරෝද රථ 2ක් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. කොන්දේසි පහත සඳහන් පරිදිය.

01. අදාළ ටෙන්ඩර්පත් 2009.10.20 දින සිට 2009.10.28 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයේ පිහිටා ඇති මහාධිකරණ කාර්යාලයේ දී නැවත ගෙවනු ලබන රු. 1,000 මුදලක් හා නැවත නොගෙවනු ලබන රු. 100ක් මුදලින් ගෙවා ලබා ගත හැකිය. එක් එක් වාහනය සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

02. මුද්‍රා තබන ලද මිල ගණන් ඇතුළත් ටෙන්ඩර්පත් 2009.10.29 දින ප. ව. 1.00 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවීම හෝ අතින් ගෙනවිත් එම ලිපිනයේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'වාහන සඳහා මිල ගණන්' යනුවෙන් සඳහන් කළ යුතු ය.

03. ටෙන්ඩර්පත් විවෘත කිරීම 2009.10.29 දින ප. ව. 2.00 ට හලාවත කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් හලාවත මහාධිකරණයෙන් සිදු කෙරේ. මෙම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරන ලද අයට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

04. මෙම වාහන 2009.10.20 සිට 2009.10.28 දක්වා මාරවිල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී සතියේ වැඩ කරන දිනවල පෙ.ව . 10.00 සිට ප. ව. 3.00 දක්වා වූ කාර්යාල වේලාවන්හි දී අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසු පරීක්ෂා කර බැලිය හැකිය.

අවිධිමත් හා ප්‍රමාද වී ලැබෙන මිළ ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

#### උපලේඛනය

| *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *සිලින්ඩර් ධාරිතාව* |
|---|---|---|
| 1. NW - JK 2529 | Theewheeler - Bajaj | 150CC |
| 2. NW- JG 4579 | Threewheeler - Bajaj | 150CC |

එච්. සී. ජේ. මඩවල,
මහාධිකරණ විනිසුරු,
සභාපති,
කලාපීය ප්‍රසම්පාදන කමිටුව,

2009 සැප්තැම්බර් මස 29 වැනි දින,
හලාවත මහාධිකරණයේ දී ය.

10-563

## ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

### අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලය ප්‍රකාරව ඉඩම විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මොරටුව, මෝදර අංක 26/339 හි පදිංචි මනතුංග බණ්ඩාර මුදියන්සේලාගේ නෙත්සිරි චන්දන ගවරම්මාන යන අය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදෙමින් සිටියදී, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් වෙත අවලංගු නොකළ හැකි ඇටෝර්නි බලය 1995 අප්‍රේල් මස 10 වැනි දින පවරමින් මෙහි පහත වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සඳහා ණය ලබාගෙන ඇති අතර ඔහු එම ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රජයට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට මෙම ඉඩම විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

අදාළ මිල ගණන් වර්ෂ 2009 නොවැම්බර් මස 07 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 4 වැනි මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - පයාගල, විහාරකන්ද පාර ඔස්සේ ගියවිට හමුවන ඉහළ වඩුගොඩ පාරට හැරී එම පාරේ කෙළවර නැවත දකුණු දෙසට හැරී යන විට හමුවන ගලේ ඉඩමට යන පාරේ මෙම ඉඩම පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා කොළඹ 10, මාලිගාවත්ත, නව මහලේකම් කාර්යාලය, 4 වැනි මහල හි, පිහිටි වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි අමතන්න. දුරකථන අංක 0112-449754.

#### විකිණීමට ඇති දේපළ

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණේ පයාගල බද්දේ ඉහළ වඩුගොඩ යන ගමෙහි පිහිටි කහටගහලන්ද නොහොත් ගමගේහේන සහ බරනාදුවාවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කැබලි අංක 1 සිට 7 න්ද, ඇටඹගහවත්ත නොහොත් ලන්ද නමැති ඉඩමේ කැබලි 6න්ද බෙදා වෙන් කළ කැබලි අංක 28 ට මායිම් උතුරට : කැබලි අංක 21 ද, නැගෙනහිරට : කැබලි අංක 27 ද, දකුණට : පාරකට වෙන් කර තිබෙන කැබලි අංක 49 ද, බස්නාහිරට : පාරකට වෙන් කර තිබෙන කැබලි අංක 49 ද, යන මෙකී මායිම් ඇතුළත මානක ඩබ්ලිව්. සෙනෙවිරත්න මහතා විසින් 1995.01.07 වැනි දින මැන සාදන ලද අංක 7755 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණය පර්චස් දහ අටක් (අ. 0, රූ. 0, පර්. 18) විශාලව ඇති ඉඩමේ මුළු බිම, ගහකොළ, පළතුරු සහ එහි තුළ තිබෙන සෑම දෙයක් වේ. මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 144/262 හි ලියාපදිංචි කර ඇත.

ලේකම්,
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය.

10-640

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

නුගේගොඩ වික්‍රමරත්න මාවත, අංක 26 හි පදිංචි අභය අලංකාර හේරත් ආරච්චිගේ සිරි බක්මීදෙණිය වන මා විසින් කහවත්ත, යායින්න අක්කර අසුවේ පදිංචි හේවා හල්පගේ කුලරත්න යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කර ගන්නා ලද්දේ මම නිරන්තරව විදෙස් ගත වන බැවින් එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් දේපළ පාලනය කිරීමේ අපහසුතාවයට පිළියමක් වශයෙන් බැවිනුත් ඔහු නමින් ඇති ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියානි විජයගුණවර්ධන මහත්මිය විසින් ලියා සහතික කළ 2005.05.25 වැනි දින හා අංක 19060 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2009.09.17 වැනි දින සිට මා විසින් අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනාම වෙත දන්වා සිටිමි.

අසෝක වික්‍රමසිංහ,
නීතිඥ සහ දිවුරුම් කොමසාරිස්.

අංක 606 ඒ,
නව නගරය, රත්නපුරය.

10-641

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමි.

නාමය : බ්‍රිටිෂ් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලි. ප. අ. : පී. වී. 69164
දිනය : 2009.09.14
ලිපිනය : No. 15-2/1, Sirambiyady Lane, (Off Stanly Road) Jaffna

ඒ. එස්. පුනිතසේකරන්,
ලේකම්.

2009 සැප්තැම්බර් මස 30 වැනි දින.

10-639

---

## සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාව වෙත කෙරෙන දැන්වීම

ජෙනරල් ටුවර්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 ජූලි 22 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. එහි ලියාපදිංචි කාර්යාලය පන්නිපිටිය සෙත්සිරි පෙදෙසේ සහ අංක 558/29 දරන ස්ථානයේ පිහිටා ඇත. සමාගම් අංකය : පී. වී. 68534.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
එම්. ඩී. ජයවික්‍රම මිය,
ලේකම්.

2009 අගෝස්තු මස 18 වැනි දින දී ය.

10-585

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව කුඩාපාඩුව සී වීව් පාර අංක 6/1 හි පදිංචි වර්ණකුලසූරිය චන්ද්‍රානි ප්‍රනාන්දු විවාහයට පසු වැන් ඩෙන් බෝන් වන මම සඳරූස් අයි. රූදිගු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2008 ජූලි මස 22 වැනි දින සහතික කළ අංක 872 දරන ඇටර්නි බලපත්‍රයෙන් මීගමුව කුඩාපාඩුව පීටර් මෙන්ඩිස් මාවත අංක 14/4 හි පදිංචි වර්ණකුලසූරිය දොන් එඩ්රියල් ශ්‍රී ලාල් ප්‍රනාන්දු හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

10-613

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමි.

නාමය : මොරා ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලි. ප. අ. : පී. වී. 60899
දිනය : 2007.08.03
ලිපිනය : අංක 103 ඒ, මන්නාර් පාර, වව්නියාව

ආර්. රගුරාජා,
ලේකම්.

10-638

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගල්හින්න, බටගොල්ලාදෙනිය, අංක 100 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් හනීෆා මවුජුඩ් වන මම ගම්පල ප්‍රසිද්ධ නොතාරිස් නිරංජලා රත්නායක මහත්මිය විසින් වර්ෂ 2007.09.16 වැනි දින ලියා සහතික කරන ලද අංක 95 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ගල්හින්න, බටගොල්ලාදෙනිය, අංක 100 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් හනීෆා මොහොමඩ් අමාන් නමැති අයට ලබා දී තිබූ ඇටෝනි බලයන් සියල්ල අද දින වන 2009.09.10 සිට ප්‍රත්‍යදිෂ්ට කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියලු මහජනතාවටත් අන් සියලුදෙනාටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

මොහොමඩ් හනීෆා මවුජුඩ්.

10-522

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය යටතේ පහත සඳහන් ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කොට ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඇන්ට්ලර් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඇන්ට්ලර් ග්‍රැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් දෙක, ඇන්ට්ලර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග, සමාගම් පනතේ viii කොටසේ විධිවිධාන ප්‍රකාරව ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කොට ඇති අතර, ඒකාබද්ධ කළ සමාගම ඇන්ට්ලර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් තවදුරටත් ක්‍රියාත්මකවනු ඇත.

සමාගමේ අංකය - පී. වී. 7699

සමාගම්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 2009 අගෝස්තු 17 වැනි දින, ඒකාබද්ධ කිරීමේ සහතිකය, සමාගම් පනතේ 244(1) (අ) වගන්තිය ප්‍රකාරව නිකුත් කොට ඇත.

ලියාපදිංචි කාර්යාලය ඃ අංක 170, මඩපාත පාර, පිළියන්දල.

අධ්‍යක්ෂ මණ්ඩල
ඇන්ට්ලර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සහ
ඇන්ට්ලර් ග්‍රැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ඇන්ට්ලර් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009 සැප්තැම්බර් මස 08 වැනි දින.

10-542

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංගොඩ, දෙල්ගහවත්ත අංක 215 හි මුතු ආරච්චිගේ විජිත ජයසිරි වන මා විසින් මුතු ආරච්චිගේ අශෝක නන්දසිරි වෙත බලය පවරමින් රෝහිත අමරසිරි නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් මගින් ලියා සහතික කළ අංක 30 හා 2009.08.01 දිනැති දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2009.10.01 දින සිට අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

එම්. ඒ. විජිත ජයසිරි.

10-551

---

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

සමාගම් නාමය ඃ රූල් ඔෆ් ලෝ ෆෝරම්
ලියාපදිංචි අංකය ඃ GA2302
සංස්ථාගත කළ දිනය ඃ 2009 සැප්තැම්බර් මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය ඃ අංක 03, විජේවර්ධනාරාම මාවත, නාවල පාර, නුගේගොඩ.

සමාගම් ලේකම්/අධ්‍යක්ෂ.

10-556

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 5, උද්‍යාන පාරේ, අංක 215 සී 1/1 හි සහ දැනට කැනඩාව එම්9බී 6සී3, ඔන්ටාරියෝ, ටොරොන්ටෝ, යුනිට් # 138, වැල්හැල්ල ඉන් පාර, අංක 2 හි පදිංචි කොර්නේලියා ශෂිකලා ජෙනී ප්‍රගාසම් වන මා විසින් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර, ගැමුණු මාවත, අසෝක වටමාවත, අංක 21 හි පදිංචි ෆිලික්ස් එයින්ස්ටීන් මෝහාන් ප්‍රගාසම් වෙත පවරනලද සහ ඔන්ටාරියෝ එම්5ජ්4, ප්‍රසිද්ධ නොතාරිස් බෝලා ඇඩටුන්පි විසින් සහතික කරන ලද 2007 පෙබරවාරි මස දහනව වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙයින් අහෝසිකර අවලංගු කරන බවත් එහි ඇටෝර්නි බලකරු විසින් සිදුකරනු ලබන කිසිදු ගනුදෙනුවකට මින් ඉදිරියේදී මා විසින් වග නොකියන බවටත්. ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

කෝර්නේලියා ශෂිකලා ජෙනී ප්‍රගාසම්.

10-483

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත, කෝපියාවත්තේ, අංක 16 දරන ස්ථානයේ පදිංචි මිහිඳුකුලසූරිය මේරි ලූසී ප්‍රනාන්දු වන මම ශ්‍රී ලංකා ජනරජය වෙත මෙයින් දන්වා සිටින්නේ මා විසින් වර්ෂ 2005 ක් වූ සැප්තැම්බර් මස 2 වැනි දින ඩබ්ලිව් ටී. ටෙනිසන් ප්‍රනාන්දු නොතාරිස් තැන ලියා සහතික කළ අංක 8347 දරන ඇටෝර්නි බලපත්‍රය පිට හලාවත, කෝපියාවත්තේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 460911494 හිමි මිහිඳුකුලසූරිය ජෝන් ක්ලීමන් ප්‍රනාන්දු මහතාට එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකරන ලෙස බලය පැවරූ අතර, වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 10 වන දින සිට මෙම ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කරන්නට යෙදුණු අතර එම බලපත්‍රයේ සඳහන් සියලු බලතලද මෙයින් අවලංගු කර නිශ්ප්‍රභා කරන්නට යෙදුනා ඇත. අදාළ ඇටෝර්නි බලපත්‍රය උතුරු මැද සහ වයඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ 2005.11.23 වැනි දින, දින පොත් අංක 1457 යටතේ 10 වැනි වෙලුමේ 520 වන පිටුවේ ලියා පදිංචි කර ඇත.

තවද වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින සිට මෙම ඇටෝර්නි බලපත්‍රය සම්බන්ධයෙන් මිහිඳුකුලසූරිය ජෝන් ක්ලීමන් ප්‍රනාන්දු යන අය විසින් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට මා විසින් කිසිදු වගකීමක් නොදරන අතර ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් 10 වැනි දින සිට බලරහිත බවත්, අවලංගු බවත් වැඩි දුරටත් සහතික කොට ප්‍රකාශ කරමි.

මෙයට,
මිහිඳුකුලසූරිය මේරි ලූසී ලුවීනා ප්‍රනාන්දු.

වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින දීය.

10-559

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නමඃ මොනාච් ෆාර්මසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 69236
ලියාපදිංචි ලිපිනය : අංක 133/14ඒ ගෝතමී පෙදෙස, රාජගිරිය,
සංස්ථාගත දිනය : 2009.09.17

ටී. සී. එච්. එන්. පීරිස්,
අධ්‍යක්ෂ.

10-596

---

## නිවේදනයයි

2007 වසරේ අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 9 ජේදය යටතේ වන විධිවිධාන අනුව පහත සඳහන් සමාගම සංස්ථාපිත (ලියාපදිංචි) කළ බව නිවේදනය කර සිටින්නෙමු.

සමාගමේ නම : SUA CEYLON RESORTS සී/ස සුව සිලෝන් රිසෝට්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 69329
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාපිත දිනය : 2009 සැප්තැම්බර් මස 25 වැනි දින

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස්
(පුද්ගලික) සමාගම.

10-595

---

## නිවේදනයයි

වසර 2007, අංක 7 දරන සමාගම් පනතේ, 9 වැනි ජේදය යටතේ වන විධිවිධාන අනුව, පහතින් සඳහන් සමාගම සංස්ථාපිත (ලියාපදිංචි) කළ බව අප නිවේදනය කර සිටින්නෙමු.

සමාගමේ නම : සී/ස තෝමස් ලංකා හොටේල්ස් ඇන්ඩ් රිසෝට්ස් (පුද්ගලික)
සමාගමේ අංකය :පී. වී. 69264
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 32/3, මල් පාර, කොළඹ 07
සංස්ථාපිත දිනය : 2009 සැප්තැම්බර් මස 22 වැනි දා

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික).

10-594

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ජනතාවට කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) ජේදය යටතේ වන විධිවිධාන අනුව පහත සඳහන් සමාගම මෙතෙක් භාවිතා කළ නාමය වෙනස්කර ඇති බව (2009 සැප්තැම්බර් 2 වැනිදින සිට ක්‍රියාත්මක වන පරිදි) මෙයින් දැනුම් දෙනු ලැබේ.

කලින් භාවිතා කළ නාමය : MANITHA TRADING සී/ස මැනිතා ට්‍රේඩිං (පුද්ගලික) සමාගම
නව නාමය : M. N. ENTERPRISES සී/ස M. N. එන්ටප්‍රයිසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : P. V 65783
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 47, ඇලෙක්සැන්ඩ්‍රාර් ප්ලේස්, කොළඹ 07

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (පුද්ගලික.)

10-592

---

## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 9 ජේදය යටතේ වන විධි විධාන අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : I. S. C. LOGISTICS LANKA (PVT) LTD. සී/ස ලොජිස්ටික්ස් ලංකා (පුද්ගලික)
සමාගමේ අංකය : පී වී 69130
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : සූට් (SUITE) 3බී නිව් ෆෝබ්ස් ඇන්ඩ් වෝකර් ගොඩනැගිල්ල, 46/42, නවම් මාවත, කොළඹ 02
සංස්ථාපිත දිනය : 2009.09.11

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්
(පුද්ගලික) සමාගම.

10-593

---

## නිවේදනයයි

වර්ෂ 2007, අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ජේදය යටතේ වන විධිවිධාන අනුව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : (PENIEL BLESSING TRUST) සී/ස පීනියල් බ්ලෙසිං ට්‍රස්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : ජී ඒ 2297
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 50, කැළණිමුල්ල වලව්ව, කැළණිමුල්ල, අංගොඩ
සංස්ථාපිත (ලියාපදිංචි කළ) දිනය : 2009 සැප්තැම්බර් 09.

සමාගම් ලේකම්වරු,
සී/ස කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්
(පුද්ගලික) සමාගම.

10-591

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, සිය නාමය, 2009 සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කේ. එම්. පී. ජී. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමටඩ් යනුවෙන් වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : කේ. එම්. පී. ජී. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 12390
ලියාපදිංචි කාර්යාලය : අංක 32 ඒ, ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකාර් මාවත, කොළඹ 03

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙක්‍රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 32 ඒ, පළමු මහල,
ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාකාර් මාවත,
කොළඹ 03.

10-632

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව ලූවිස් පෙදෙස සී වී වී පාර අංක 02 හි පදිංචි වර්ණකුලසූරිය චන්ද්‍රනී ප්‍රනාන්දු වන මම සඳරුස් අයි. රුළිගු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006 අගෝස්තු මස 08 වන දින සහතික කළ අංක 492 දරන ඇටර්නි බලපත්‍රයෙන් මීගමුව කුඩාපාඩුව පීටර් මෙන්ඩිස් මාවත අංක 14/4 හි පදිංචි වර්ණකුලසූරිය දොන් එඩ්රියල් ශ්‍රී ලාල් ප්‍රනාන්දු හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

10-614

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව ලූවිස් පෙදෙස සී වී වී පාර අංක 2 හි පදිංචි වර්ණකුලසූරිය චන්ද්‍රනී ප්‍රනාන්දු වන මම සඳරුස් අයි. රුළිගු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2008 මාර්තු මස 17 වන දින සහතික කළ අංක 821 දරන ඇටර්නි බලපත්‍රයෙන් මීගමුව කුඩාපාඩුව පීටර් මෙන්ඩිස් මාවතේ අංක 14/4 හි පදිංචි වර්ණකුලසූරිය දොන් එඩ්රියල් ශ්‍රී ලාල් ප්‍රනාන්දු හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

10-615

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව ලූවිස් පෙදෙස සී වී වී පාර අංක 2 හි පදිංචි වර්ණකුලසූරිය චන්ද්‍රානී ප්‍රනාන්දු වන මම සඳරුස් අයි. රුළිගු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006 අගෝස්තු මස 08 වන දින සහතික කළ අංක 491 දරන ඇටර්නි බලපත්‍රයෙන් මීගමුව කුඩාපාඩුව පීටර් මෙන්ඩිස් මාවතේ අංක14/4 හි පදිංචි වර්ණකුලසූරිය දොන් එඩ්රියෙල් ශ්‍රී ලාල් ප්‍රනාන්දු හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මේයන් දන්වා සිටිමි.

10-616

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 242(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සම්පත් සුරැකුම් ලිමිටඩ් ආයතනය සම්පත් බැන්ක් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කිරීම

සම්පත් සුරැකුම් ලිමිටඩ් (එස්එස්එල්) ආයතනය සහ සම්පත් බැන්ක් පීඑල්සී (එස්බීපීඑල්සී) විසින් එක් එක් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ පිළිවෙලින් වූ 2009 ජූලි මස 27 වන දින සහ 2009 ජූනි මස 25 වන දින දරන අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මත මගින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එකී සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට තීරණය කර ඇති බවට සහ එම ඒකාබද්ධ කරන ලද සමාගම සම්පත් බැන්ක් පීඑල්සී යන ආයතනය විය යුතු බවට යෝජනා සම්මත කර සිටී.

පිළිවෙලින් 2009 සැප්තැම්බර් මස 08 වැනි දින සහ 2009 අගෝස්තු මස 27 වන දින සම්පත් සුරැකුම් ලිමිටඩ් ආයතනයේ සහ සම්පත් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ ආකාරයට 2009 නොවැම්බර් මස 03 වන දින සිට එකී ඒකාබද්ධ කිරීම බලපැවැත්විය යුතුය.

ඒකාබද්ධ කරන ලද සමාගමේ ලියාපදිංචි කාර්යාලය සම්පත් බැන්ක් පීඑල්සී ආයතනයේ වර්තමාන ලියාපදිංචි කාර්යාලය විය යුතුය.

ඒකාබද්ධ කරන සමාගමේ අධ්‍යක්‍ෂවරුන් සම්පත් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්‍ෂකරුවන්ම විය යුතුය.

සම්පත් සුරැකුම් ලිමිටඩ් ආයතනයට හෝ සම්පත් බැන්ක් පීඑල්සී ආයතනයට ඉල්ලීමක් කිරීම මගින් 2009 දෙසැම්බර් මස 31 වන දින දක්වා සාමාන්‍ය ව්‍යාපාරික කාලයන්හි දී කොළඹ 02 සර් ජේම්ස් පීරිස් මාවතේ අංක 110 දරන ස්ථානයේ අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මත සහ අධ්‍යක්‍ෂවරුන්ගේ සහතික පත්‍ර අධීක්ෂණය සඳහා සහ/හෝ ඉහත කී සමාගම්වල යම් බැඳීමක් ඇත්තාවූ යම් කොටස්කරුවෙකුට හෝ ණය හිමියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට නොමිලේ සැපයීම සඳහා තබා ඇත.

| | |
|---|---|
| *අත්සන් කලේ* | *අත්සන් කලේ.* |
| එම්. ඒ. අබේනායක | ජී. එල්. එච්. ප්‍රේමරත්න |
| අධ්‍යක්‍ෂ | අධ්‍යක්‍ෂ |
| සම්පත් සුරැකුම් ලිමිටඩ් | සම්පත් බැන්ක් පීඑල්සී ආයතනය |
| සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය :- පීබී 538. | සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය :- පීකිව් 144. |

10-459

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මරදාන ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වී. එම්. එම්. ප්‍රනාන්දු විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 867 සහ 2003.06.22 දින දරන ණය බැඳුම්කරය මත හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 3109 සහ 2008.02.19 දින දරන ණය බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම බෙස් එන්ටර්ටේයින්මන්ට්ස් (පුද්ගලික) සමාගම වෙනුවෙන් රත්නායක මුදියන්සේලාගේ ගුණතිලක ප්‍රදීප් ලංකා රත්නායක යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 04 වන දින පෙ.ව. 10.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, මැටිකොටුවෙහි පිහිටි කහටගහඹිටිට දෙකෙන් පංගුව කැබැල්ල නමැති ඉඩම් කොටසට බලයලත් මානක එස්. බී. අබේකෝන් විසින් මැන සාදන ලද අංක 1537 සහ 1988.10.31 දින දරන පිඹුර සහ බලයලත් මානක එස්. බී. අබේකෝන් විසින් එකී අංක 1537 දරන පිඹුරේ 2004.06.10 දින ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 දරන ඉඩම් කොටස. විශාලත්වය අ. 0, රූ. 1, පර්. 37 කි.

*වැඩිදුර විස්තර සඳහා.-* 2009.08.28 වන දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.08.31 වන දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.-* කොළඹ පුත්තලම පාරේ පැමිණෙන විට හමුවන තෝප්පුව හංදියෙන් දකුණට ඇති නාත්තන්ඩිය පාරේ කි. මී. 2 ක් පමණ පැමිණි පසු දකුණු පසින් හමුවන මැටිකොටුව පාරේ කි. මී. 2 ක් පමණ ඉදිරියට පැමිණෙන විට පාරට මායිම්ව දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදලද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2664664.

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356.

10-618

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - හික්කඩුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංකය පී. කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. (බලයලත් මානක ටී. ජී. පී. උපසේන විසින් 2004 පෙබරවාරි මස 13 වන දින සාදන ලද අංක 316ඒ දරන පිඹුර පරිදි ලොට් 1 වශයෙන් වෙන් කරන ලද කොටසේ නැවත බෙදීමක් වන) බලයලත් මානක ටී. ජී. උපසේන විසින් 2004 මාර්තු මස 10 වන දින සාදන ලද අංක 316 බී දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ හිරිඹුර පිහිටි කයිලගහවත්ත ඉඩමේ ලොට් 3 දරන, පර්චස් දහයයි දශම හතරයි නවයක් (අ. 0, රූ. 0, පර්. 10.49) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළු දේත් සමග.

2. බලයලත් මානක ජී. ඩී. එස්. කරුණාතිලක විසින් 1964 අප්‍රේල් මස 25 වන දින සහ මැයි මස 3 වන දින සාදන ලද අංක 239 ඒ දරන පිඹුර පරිදි එකී හික්කඩුව නාරිගම සහ වැවල පිහිටි කෝන්ගහවත්ත හෙවත් පැලකැටියෙවත්ත සහ පැලකැටියෙවත්ත හෙවත් ජන්ගෙඅම්මගෙවත්ත කියන (ගාල්ල දිසා අධිකරණයේ අංක පී/2395 දරන නඩුවේ වාර්ථාගත වී ඇති) ඒකාබද්ධ සහ යාබද ලොට් 14, 15, 16 සහ 17 එක් කර බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන, පර්චස් තිස්පහයි දශම තුනයි බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0. පර්. 35.302) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග.

3. බලයලත් මානක ආර්. එස්. වීරසේකර විසින් 2001 ජුනි මස 12 වන දින සාදන ලද අංක 840 දරන පිඹුර පරිදි එකී වැවල පිහිටි කෝන්ගහවත්ත හෙවත් පැලකැටියෙවත්ත සහ පැලකැටියෙවත්ත හෙවත් ජන්ගෙඅම්මගෙවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 22 ඒ දරන, පර්චස් නවයයි දශම හතයි පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 9.751) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළු දේත් සමග.

4. එකී හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුර පරිදි බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ

අංක පී/1559 දරන නඩුවේ වාර්තාගතවී ඇති ලොට් 10 දරන, පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළු දේත් සමග.

5. එකී හික්කඩුවේ වැවල පිහිටි කහටගහවත්ත කියන ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 11 දරන, පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළු දේත් සමග.

6. එකී හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වන දින සාදන ලද අංක 7059 දරන පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගතව ඇති ලොට් 17 දරන, පර්චස් තිස්හයක් (අ. 0, රූ. 0. පර්. 36) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළු දේත් සමග.

7. එකී හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වන දින සාදන ලද අංක 7059 දරන පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගතව ඇති ලොට් 18 දරන පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළු දේත් සමග.

8. බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. ද සිල්වා විසින් 1992 අප්‍රේල් මස 16 සහ 21 වැනි දිනයන්හි සාදන ලද අංක 3950 දරන බෙදුම් පිඹුර පරිදි, දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව පිහිටි ඔරුතොට පැලකැටියෙවත්ත කියන ගාල්ල දිසා අධිකරණයේ අංක පී/9258 දරන බෙදුම් නඩුවේ වාර්තාගතවී ඇති ලොට් 5 දරන පර්චස් දහතුනයි දශම අටයි අටක් (අ. 0, රූ. 0, පර්. 13.88) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළු දේත් සමග.

9. බලයලත් මානක එච්. බී. ගුණවර්ධන විසින් 1946 ජනවාරි මස 12 වන දින සාදන ලද අංක 2102 බී දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව පිහිටි මාදන්ගහවත්ත හෙවත් දංගහවත්ත කියන ගාල්ල දිසා අධිකරණයේ අංක 39018 දරන නඩුවේ වාර්තාගතවී ඇති ලොට් 7 දරන රූඩ් එකයි පර්චස් හතරක් (අ. 0, රූ. 01, පර්.4) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළු දේත් සමග.

හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන් උකස්කරු හැටියටද, ඔවුන් විසින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී ට උකස් කරන ලද ඉහත සඳහන් කල දේපල, හිරිඹුර පිහිටි ලොට් 3 දරන පර්චස් 10.49 විශාල ඉඩම වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 10 වන දින පෙ.ව. 10.00ට ද, හික්කඩුව, නාරිගම සහ වැවල පිහිටි ලොට් '1' දරන පර්චස් 35.302 ඉඩම සහ වැවල පිහිටි ලොට් 22 ඒ දරන පර් 9.751 විශාල ඉඩම වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 10 වන දින ප.ව. 12.30 වද, හික්කඩුව වැවල පිහිටි :- ලොට් 10 දරන පර්. 6, ලොට් 11 දරන පර්චස් 7.5 ලොට් 17 දරන පර්. 36 ලොට් 18 දරන පර්. 7 ඉඩම්, වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින ප.ව. 1.30 ට ද, හික්කඩුව ඔරුතොට පැලකැටියෙවත්ත පිහිටි ලොට් 5 දරන පර්. 13.88 විශාල ඉඩම වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින ප. ව. 3.00 ට ද,

හික්කඩුව මාදංගහවත්ත හෙවත් දංගහවත්ත පිහිටි ලොට් 7 දරන රූඩ් 1 පර්චස් 4 විශාල ඉඩම වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින ප.ව. 4.30 ට ද ඉහත ස්ථානයන්හිදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.06.19 වන දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2009.06.23 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.10.16 වන දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2009.10.20 වන දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩමට පිවිසීම.*- කරාපිටිය රෝහල මංසන්ධියේ සිට හිරිඹුර පාරේ මීටර් 150 ක් පමණ ඉදිරියට ගියවිට වම්පසින් පිහිටා ඇත.

*2 වැනි 3 වැනි උපලේඛනයන්හි සඳහන් ඉඩම්වලට පිවිසීම.*- හික්කඩුව කොමර්ෂල් බැංකුවේ සිට ගාලුපාර ඔස්සේ කොරල් ගාඩ්න් හෝටලයද පසුකොට මීටර් 150 ක් පමණ ගියවිට වම්පසින් වේවැල්ගොඩ පාර හමුවේ. එතැන් සිට තවත් කිලෝමීටර් 1 ක් ඉදිරියට ගියවිට දකුණු පසින් අදාල දේපල හමුවේ.

*4, 5, 6 සහ 7 වැනි උපලේඛනයන්හි සඳහන් ඉඩම්වලට පිවිසීම.*- හික්කඩුවේ සිට ගාලු පාර ඔස්සේ වැවල මංසන්ධිය දක්වා ගොස් වම්පසින් ඇති එස්. ආර්. නානායක්කාර මාවතට හැරී මීටර් 750 ක් පමණ ගොස් රෝටාස් බේකරිය ඉදිරිපිටින් දකුණට හැරී මීටර් 200 ක් පමණ ඉදිරියට ගියවිට වංගුවත් සමග දකුණු පසින් අදාල දේපල හමුවේ.

*8 වැනි උපලේඛනයේ සඳහන් ඉඩමට පිවිසීම.*- හික්කඩුව බස් නැවතුම් පොලේ සිට කොළඹ දෙසට මීටර් 300 ක් පමණ ගියවිට ඔබගේ වම්පසින් (අබාන්ස් ප්‍රදර්ශණාගාරයට විරුද්ධ පසින්) අදාල දේපල හමුවේ.

*9 වැනි උපලේඛනයේ සඳහන් ඉඩමට පිවිසීම.*- හික්කඩුවේ සිට ගෝනපිනුවල පාරේ කි. මී. 1.50ක් පමණ ගියවිට දකුණු පසින් එස්. ආර්. නානායක්කාර පාර හමුවේ. පසුව කියන ලද පාරේ මීටර් 500 ක් පමණ ගොස් වම්පසින් ඇති පන්නයානන්ද මාවත හමුවේ. පන්නයානන්ද මාවතේ මීටර් 250ක් පමණ ගියවිට වම්පසින් ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2000 බැගින් හා ගමන් ගාස්තු,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 බැගින්,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ හික්කඩුව ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්,
අංක 99,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකයඃ 011-2445393

කලමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක : 217, ගාලු පාර,හික්කඩුව,
දුරකථන අංකය : 091-2277398 ෆැක්ස් අංකය : 091-2276533

10-487

**හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - වැල්ලවත්ත ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් 2007.05.08 වැනි දින හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී නමට ලියා සහතික කරන ලද අංක 3100 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තංගසාමි සක්තිකුමාරන් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් අයකර ගැනීම සඳහා,

ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත විස්තර කර ඇත්තාවූ දේපල වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 09 වැනි දින පෙ.ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.28 දින *ගැසට් පත්‍රයේ* සහ 2009.09.02 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ (හැඳල උප කාර්යාලය) තුළ හැඳල ඇළ පාරෙහි පිහිටි මුතුරාජවෙල නැමති ඉඩමට බලයලත් මානක එස්. ජී. ගුණතිලක විසින් 2004.06.05 වැනි දින මැන සාදන ලද අංක 3186 දරන පිඹුරෙහි ලොට් ඒ 28 දරන කොටස.

ප්‍රමාණය : පර්චස් හයයි දශම පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 6.05)

*දේපළට පිවිසීම .-* පැලියගොඩ හන්දියේ සිට කොළඹ - මීගමුව ප්‍රධාන මාර්ගයේ කි. මී. 3.5ක් ගමන් කොට වමට හැරී හැඳල මාර්ගයේ කි. මී. 3.6 පමණ ගමන් කිරීමේ දී හමුවන ඇළ පාරෙන් (කැනල් පාර) දකුණට හැරී කි. මී. 1ක් පමණ ගමන් කිරීමේදී දකුණට හැරී යන නිවාස යෝජනා ක්‍රමය පාරේ මීටර් කිහිපයක් ගමන් කිරීමේ දී මෙම දේපලට ලඟාවිය හැක.

*ගෙවීමේ ක්‍රමය :-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් 1% (සියයට එකක්),
3. සියළුම ප්‍රචාරක ගාස්තු,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12
දුරකථන අංකය : 071 - 4175944

10-606

---

**කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මාතලේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ වේගිරිය ගමේ හොඩියාදෙණිය - ලුනුගම මාර්ගයට මායිම්ව පිහිටි කොටුවේගෙදර වත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. ඩී. පී. ගුණවර්ධන විසින් සාදන ලද 2005.01.21 වැනි දින අංක 1311 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 3 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියළු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 15.

මෙම දේපල, අතාව්ඩා මුදියන්සේලාගේ ඉන්දික ප්‍රදීප් කුමාර ජයවර්ධන යන අය ණයකරු වශයෙන්, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-*මහනුවර සිට ගම්පොල මාර්ගයේ ගෙලිඔය කඩමණ්ඩිය දක්වා පැමිණ දකුණට හැරී ගංහත පාරට පිවිස කි. මී. 3.50 ක් පමණ වේගිරිය හන්දිය දක්වා පැමිණ වම් දෙසට පිහිටි ලුණුගම පාරට ඇතුළු වී මීටර් 250 ක් පමණ ගිය පසු අදාල දේපල පිහිටා තිබේ. 2009 ක් වූ නොවැම්බර් මස 26 වැනි දින ප.ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.07.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2009.07.03 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට

දින 30 ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ප්‍රධාන කාර්යාලයට හෝ මාතලේ ශාඛාව වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. රජ වීදිය, මාතලේ.

දුරකථන අංක : 066-2231880/2231870/2222485.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5 බෝමළුව පාර,
වටපුළුව, මහනුවර
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය : 081-2211025.

10-531

---

### පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය මූන්දල් කොට්ඨාසයේ, කීල් අක්කරෙපත්තු කට්ටයිකාඩු උතුරේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සකසන ලද 2004.04.25 දින දාතමින් යුත්, අංක 3904/1 පිඹුරු පතෙහි දක්වන ලද, මාන්චෝලයි වත්ත හෙවත් මින්චෝලයි එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමේ ලොට් අංක 1 ලෙස සලකුණු කරන ලද, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද සියල්ල ඉඩමේ ප්‍රමණය : අක් 22, රූඩ් 1, පර්. 12.5 එහි ඇති සියල්ල සමග.

*මාර්ගය සහ පිහිටීම.-* කොළඹ සිට කොළඹ - පුත්තලම පාරේ කිලෝමීටර් 113 ක් පමණ දුරක් ගිය පසු මදුරන්කුලී මංසන්ධියට පිවිසිය හැක. එම මංසන්ධියෙන් වමට හැරී කිලෝමීටර 5 ක් තොඩුවාව පාරේ (බස් මාර්ගයකි) ගමන් කළ විට දකුණු පැත්තෙහි පිහිටි බිම් කොටස කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද, 2005 ඔක්තෝබර් මස 21 වැනි දිනැති, අංක 1803 උකස්කරය ප්‍රකාර, රිසාන් එක්ස්පෝට්ස් නමින් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මොහොමඩ් සහාබ්ඩීන් මොහොමඩ් රියාස් විසින් (සීමාසහිත පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටු කර ඇත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 නොවැම්බර් මස 06 වැනි දින (සිකුරාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්), විකුණුම් බදු,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000 කට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වෙන්දේසි දැන්වීම සඳහා 2008 ජූලි 28 වැනි දින ලක්බිම, සිලෝන් ඩේලි නිවුස්, සුඩර් ඔලි පුවත්පත් ද 2008 ජූනි මස 06 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450 සීමාසහිත පැන් ඒෂියා බැංකු සංස්ථාවේ කළමනාකරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත් සියවසකට වැඩි කලක්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

10-555

---

### ඩී එෆ් සී සී බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 73 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සීමාවට අයත් යටිනුවර, ගඟවට කෝරළේ, කටුකැලේ පිහිටි අංක 45, පේරාදෙණිය පාර

යන ලිපිනය දරන, බලයලත් මිනින්දෝරු ඒ. එච්. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක 106 හා 1990 සැප්තැම්බර් මස 21 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූ. 0, පර්. 1.00 *හෙවත්* හෙක්ටයාර 0.0048 එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රී විසින් සහතික කරන ලද, 2005 අගෝස්තු මස 30 වැනි දිනැති අංක 73 දරන උකස්කරය ප්‍රකාර මහනුවර මධුරාස් ෆුඩ් සෙන්ටර් නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන මණි නාදර් සිවා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 නොවැම්බර් මස 03 වැනි දින (අඟහරුවාදා) පෙ.ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන ගැනුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකහමාර),
4. රු. 34,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 200.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමත්තන : දුරකථන අංක 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත් සියවසකට අධිකකලක්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 011-2585408,
දුරකථන/ෆැක්ස් : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com.

10-554

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බගවන්තලාව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අඹගමුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බගවන්තලාව, සිරිපුරගම පිහිටි කොටියාගල එස්ටේට් හි වැල්ල්ටන් ඩිවිෂන් නමැති ඉඩමට බලයලත් මානක ඉරන්දතිස්ස කොටඹගේ විසින් සාදන ලද 2003.02.05 වැනි දින අංක 4603ඒ දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කරන ලද ලොට් 13ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 5.901 කි. මෙම දේපල, ලියනගේ අර්ෂශිලා ද සිල්වා විජේතිලක *නොහොත්* පර්සි විජේතිලක *නොහොත්* ෆයිස් මුස්තපා සහ ලියනගේ ඉස්වන්ත ද සිල්වා විජේතිලක *නොහොත්* ලියනගේ ස්මත් ද සිල්වා විජේතිලක යන අයවළුවන් ණයකරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* හැටන් නගරයේ සිට දික්ඔය - නෝර්වුඩ් හරහා බගවන්තලාව දක්වා කි. මී. 12 ක් පමණ ගිය විට බගවන්තලාව ප්ලාන්ටර්ස් ක්ලබ් (planters Club) එක ඉදිරිපිට අදාල දේපල පිහිටා තිබේ.

2009 ක් වූ නොවැම්බර් මස 10 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.08.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.09.07 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 1 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද.

ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011-2661816, 011-2661815.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව,
මහනුවර,
දුරකථන අංකය : 081-2211025, 071-4755974 ෆැක්ස් : 081-2211025.

10-539

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කළුතර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියා සහතික කරන ලද 2005.10.04 වැනි දින අංක 7723 සහ 2006.05.31 වැනි දින අංක 8042 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලසන්ත මනෝජ් කුමාර ජයවීර යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් ප්‍රමාණයන්ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ දේපල වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බේරුවල ප්‍රාදේශීය සභා සීමාව තුල මග්ගොන, බැද්දේ නැගෙනහිර, මග්ගොන පිහිටි ගෙදරවත්ත නමැති ඉඩමට බලයලත් මානක බී. කේ. පී. ඩබ්. ගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 1471 සහ 2005 ජූලි මස 25 වැනි දින දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් සී දරන කොටස ප්‍රමාණය : පර්චස් එකොළහයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 11.6)

*පිවිසීම.-* කළුතර නගරයේ සිට ගාළු පාරේ ප්‍රධාන මාර්ගයේ කි. මී. 10.5 ක් පමණ ගමන් කොට මග්ගොන හන්දිය පසුකොට මීටර් 100 ක් ගමන් කිරීමේදී හමුවන ශාන්ත මේරි පාරේ මීටර් 100 ක් පමණ නැවත ගමන්කොට වමට හැරෙන ජයකොඩි මාවතේ මීටර් 75 ක් ගමන් කොට එම මාර්ගයේම ගමන් කිරීමේ දී පල්ලිය පිටුපසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.08.25 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
3. සියළුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. මුද්දර ගාස්තු,
6. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
7. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නො. 479 ටී. බී. ජායා මාවත කොළඹ 10. දුරකථන අංක 2661826 වෙතින් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පාර - කොළඹ 12,
දුරකථන අංක : 071-4175944.

10-609

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - පානදුර ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියා සහතික කරන ලද 2004.01.05 වැනි දින අංක 715 සහ 2004.09.17 වැනි දින අංක 1068 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහවිදානලාගේ විමල් නන්දන ෆර්ඩිනැන්ඩෝ යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇත්තාවූ දේපල වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින ප.ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.28 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.09.03 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර සුළු නගර සභා සීමාව තුළ වැකඩ පිහිටි ගනේවත්ත පාවුල ඕවිට නමැති ඉඩමට බලයලත් මානක ජී. මල්වැන්න විසින් මැන සාදන ලද 1997.10.04 වැනි දින අංක 1062 දරන පිඹුරෙහි ලොට් අංක 1 දරන කොටස. ප්‍රමාණය පර්චස් දහයයි දශම එකයි බින්දුවයි (අ. 0, රූ. 0, පර්. 10.10)

*දේපළට පිවිසීම.-* පානදුර නගරයේ ඔරලෝසු කණුව අසලින් හැරී යන හොරණ පාරේ කි. මී. 1.3 ක් පමණ ගමන් කිරීමේ දී හමුවන (වැකඩ සමුපකාර වෙළඳ සැල ඉදිරිපිටින්) දකුණට හැරී යන වලපොල ප්‍රාදේශීය

සභා පාරේ මීටර් 100 පමණ ගමන් කිරීමේ දී (පන්සල සහ පළමු වමට හැරීම පසුකොට) වමට හැරී යන තාර පාරේ (පඤ්ඤානන්ද පාරේ) තවත් මීටර් 100 පමණ ගමන් කිරීමේ දී හමුවන හතරමන් හන්දියේ පාරට මුහුණලා දකුණු පසින් වරිපනම් අංක 28 බී වශයෙන් හැඳින්වෙන මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
3. සියළුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., නො. 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක 2664664 වෙතින් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944

10-610

---

### ඩී. එෆ්. සී. සී. බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 24299 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය. - බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත හොරම්පැල්ල ග්‍රාමයේ පිහිටි, "කන්දකැලේ" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. නන්දන සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 6859 හා 20006.05.26 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 01 ලෙස ලකුණු කල බෙදා වෙන් කල බිම් කට්ටිය ඉහත සඳහන් අංක 6859 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් විසි හතකුත් දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 27.80) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 24299 හා 2006.10.03 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "ජයබිම ප්‍රොපර්ටි ඩිවෙලපර්ස්" යන නාමය අභිධානය හා ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස දිවුලපිටියේ ව්‍යාපාරය කරගෙන යන දිවුලපිටියේ පදිංචි සුබසිංහ පතිරණගේ අසංක ප්‍රදීප් කුමාර යන අය විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපල ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල යටතේ මා විසින් 2009 නොවැම්බර් මස 19 වැනි දින පෙරවරු 11.00 ට ආරම්භ කර එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිටිය පහත හෙලා මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් පාලන අයබදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකයි දශම පහයි),
4. නොතාරිස් ගාස්තු වශයෙන් රුපියල් 2000 ක්,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රුපියල් 500,
6. සියළුම ප්‍රචාරක වියදම්.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011-2442442

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංකය : 011-3068185, 2572940
ෆැක්ස් අංකය : 2572940

10-568

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඒ. මසිලමනේ සහ ජේ. රෝසරි
ගිණුම් අංක : 1080 5000 1122

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල

ප්‍රකාර 2008 අගෝස්තු මස 28 වෙනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර ලක්ෂ අනූ දහස් නමසිය තිස් හයයි ශත තිස් එකක (රු.4,90,936.31) මුදලද 2008 ජුනි 21 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ හතලිස් දෙදහස් විසි නමයයි ශත අසූ එකක (රු.4,42,029.81) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.28 දින රජයේ *ගැසට් පත්‍රයේ,* 2009.08.24 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009.11.10 දින පෙ.ව. 10.00 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම කොට්ටාසයේ, අඹගමුව කෝරලේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශයේ හැටන් දික්ඔය නගර සභා සීමාවන් තුල හැටන් හි පිහිටි වටරවුම් පාර, දැන් වරිපනම් අංක 40 දරන "බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 1983 අප්‍රේල් 21 දාතම හා අංක 898 (CH/OC/1432) පිඹුරේ ලොට් 16 යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2005 දෙසැම්බර් 30 දාතම හා අංක 1166/2005 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : වටරවුම් පාර, නැගෙනහිරට : පිඹුරු අංක 898 හි ලොට් 17, දකුණට : එච්. රසික් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : පිඹුරු අංක 898 හි ලොට් 15 යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම නමයයි දෙකක් (පර්චස් 4.92) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1166/2005 ට අනුවය.

එකී ලොට් 1 පහත විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී හැටන් පිහිටි බලයලත් මානක තැන කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා යන අය විසින් සාදන ලද 1983 අගෝස්තු 21 දාතම හා අංක 898(CH/OC/1432/3089) දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 16 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටස මායිම් : උතුරට : වටරවුම් පාර, නැගෙනහිරට : ලොට් 17, දකුණට : එච්. රසික් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ලොට් 15 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම නමයයි දෙකක් ( පර්චස් 4.92) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරු අංක. 898 ට අනුව වෙළුම/පත්ඉරුව බී 25/265 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-586/4

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එල්. ඒ. සී. එම්. ප්‍රියදර්ශන නොහොත් එල්. ඒ. සී. එම්. පී. ප්‍රනාන්දු
ගිණුම් අංකය : 0030 5001 5849.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ දෙසැම්බර් මස 27 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් ලක්ෂ අසූ නම දහස් දෙසීය හතලිස් අටයි ශත හැත්තෑවක (රු. 7,89,248.70) මුදලද 2007 ඔක්තෝබර් 19 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් ලක්ෂ පනස් දහස් හය සියයක (රු.7,50,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරන වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකාට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009 ජුනි 26 දින රජයේ *ගැසට් පත්‍රයේ,* 2009 ජුනි 08 සහ 2009 ජුනි 04 දින "දිනමිණ", "තිනකරන්" සහ "ඩේලි නිව්ස්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009 නොවැම්බර් මස 12 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්නේශ්වරම් පත්තුවේ, උතුරු පිටිගල් කෝරලේ තඹගල්ල ග්‍රාමයේ පිහිටි "පුස්වැල්කන්ද සහ අඹගහවත්ත නොහොත් රෙජිස්ට්‍රාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2004 ජුනි 09 දාතම හා අංක. 5478 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : බලයලත් මානක තැන ඒ. ජී. එස්. බී. පරාක්‍රම යන අය විසින් සාදන ලද අංක 381 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නැගෙනහිරටː තේක්ක වත්ත (රජයේ ඉඩම) දකුණට : එකී පිඹුරු අංක 381 හි ලොට් 2 හි ඉතිරි කොටස සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර පහක් (අක්කර 5 ) විශාල ඉඩම් කොටස සමග පස ගහකොල වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන්ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව සී 185/198 හි හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-586/5

### නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කඩුවෙල ප්‍රාදේශීය සභා බත්තරමුල්ල උප කාර්යාල සීමාවන් තුළ තලංගම උතුර පොතුඅරාව පාරේ පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2000.07.29 වන දින අංක 2873 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 14 නැමති බෙදා වෙන් කළ ඉඩම් කොටස මාලබේ පොතුඅරාව හෝකන්දර පාර වරිපනම් අංක 972/5 හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියළු දේ, ප්‍රමාණය පර්චස් 12.5

මෙම දේපළ, තලංගම පදිංචි උස්වත්ත ලියනගේ නිරංගා වීරසේකර (වි.පෙ. සිල්වා) සහ නිමල් චන්ද්‍ර වීරසේකර යන අය ණයකරුවන් වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2009 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින ප.ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.11 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.08.29 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා වෙළඳ බද්ද හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ කළමනාකරු, පාරිභෝගික බැංකු (නිවාස ණය) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2437701-10

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-534

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බොරැල්ල ශාඛාව

(දැනට හැටන් නැෂනල් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2008.07.31 වන දින හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 3224 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ග්‍රේට්වෝල් ඇපරල් මැෂිනරි (පුද්ගලික) කලින් ජින්ටෙල් එම්බ්‍රොයිඩර් යන අය ණයකරු හැටියට එහි අයිතිකරු සමන් ජයසිංහ යන අය බන්ධනදායී උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති සියළු මුදල් සහ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරනු ලැබූ වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 07 දින පෙ.ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම .-* කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා හයිලෙවල් පාර ඔස්සේ මාර්ග අංක 138-125-122 නුගේගොඩ නගරය පසුකොට කි. මී. 1 පමණ ගමන් කිරීමේ දී හමුවන ගම්සභා හන්දියෙන් වමට හැරී සුභද්‍රාරාම පාර ඔස්සේ මීටර් 100 පමණ ගමන් කිරීමේදී හමුවන 2 වන පටුමග ඔස්සේ ගමන් කිරීමේ දී වරිපනම් අංක 7/1දරන දේපල හමුවේ.

තවද නුගේගොඩ ප්‍රධාන බස් නැවතුමේ සිට මාර්ග අංක 117 හෝ 289 මාර්ගයේ කට්ටිය හන්දියෙන් දකුණට හැරී සුභද්‍රාරාම පාර ඔස්සේ සුභද්‍රාරාම පිරිවෙන පසුකොට මීටර් 200පමණ ගමන් කිරීමේදී හමුවන 2 වන පටුමග ඔස්සේ ගමන් කිරීමේදී වරිපනම් අංක 7/1 දරන දේපල හමුවේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ සුභද්‍රාරාම පාරේ වරිපනම් අංක 7 හි පිහිටි ගනේලන්දවත්ත දරන ඉඩමට බලයලත් මානක පී චේතසලාම් විසින් මැන සාදන ලද 1981.10.27 දින සහ අංක 2369 දරන පිඹුරේ ලොට් අංක 4ඒ දරන කොටස.

ප්‍රමාණය පර්චස් විසි එකයි දශ තුනක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 21.3)

මෙම ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්ලිව්. කාවල්හෝ විසින් මැන සාදන ලද 2008.05.14 දින සහ අංක 25/2008 දරන සැලැස්ම ප්‍රකාර පහත අයුරින් විස්තර කරනු ලබයි.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.07.10 දින *ගැසට් පත්‍රයේ* සහ 2009.07.22 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය :-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියළුම ප්‍රචාරක වියදම්,

4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. මුද්දර ගාස්තු,
6. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
7. ලිපිකරු හා සොෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2664664 - 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 071 4175944.

10-605

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බද්ද හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : . 011-2661821, 011-2661815

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-533

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බියගම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු ඉතා වටිනා දේපළක් මහනුවර මහනගර සභා සීමාවන් තුළ දෙයියන්නේවෙල ගමේ පිහිටි හන්තාන එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඊ. එම්. පී. බී. බෝයගොඩ විසින් සාදන ලද 1990.08.08 වන දින අංක 520 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 16 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 45.8

මෙම දේපළ, චූලනී මනෝරි රණවීර සහ හර්ෂදේවි මංජුලා කෝරාල යන අය බන්ධනදායින් ලෙස හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම* .- මහනුවර නගරයේ සිට උඩුවෙල මාර්ගයේ මහනුවර රජයේ රෝහල් පරිශ්‍රය පසුකර ගමන් ගෙන දකුණු දෙසට පිහිටි තපෝධාරාම පාරට හැරී ඉදිරියට කි. මී. 0.9ක් පමණ ගිය පසු වම් දෙසින් හමුවන බොරළු පාරට ඇතුළු වී මීටර් 100ක් පමණ ගියවිට මෙම පාරට මායිම් ව දකුණු පසින් පිහිටා තිබේ.

2009 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින ප.ව. 2.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.03 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.09.09 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා 2009.09.10 දින තිනකරන් පුවත්පත බලන්න.

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අනුරාධපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට /ව්‍යාපාරයකට සුදුසු වටිනා දේපළක් නුවරගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අතුරුවැල්ල ගමේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. බී. රත්නසිරි විසින් මැන සාදන ලද 2007.07.17 වන දින අංක 2950 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි වැව්ලි ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 105.6

මෙම දේපළ, සරිෆ්ඩීන්ගේ පවුසුල් ජනෆ්ඩීන් යන අය බන්ධනදායින් ලෙස හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම* .- අනුරාධපුරය නගරයේ සිට විජේපුර ට්‍රාන්ස්ෆෝමර් හන්දියේ පොදු සුසාන භූමිය පසු කරමින් හතේ ඇළ පාර ඔස්සේ පැමිණ මල්වතු ඔය හරහා හිදෝගම තැපැල් කාර්යාලය දක්වා ගමන් ගෙන නච්චාදූව දක්වා ගමන් ගත් විට ඇල පාර හන්දියට මීටර් 75ක් පමණ ඉදිරියෙන් අදාල දේපල පාරේ දකුණු දෙසින් පිහිටා තිබේ.

2009 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙ. ව.11.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.17 වැනි දින ද දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-535

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අනුරාධපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු ගොඩනැගිලි පිහිටි දේපලක් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අලුත් ගොලුමරදන්කුලම ගමේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2004.07.31 වන දින අංක 1740 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 20.

මෙම දේපළ, සරිෆ්ඩීන්ගේ පවුසුල් ජනෆ්ඩීන් යන අය බන්ධනදායින් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම .-* අනුරාධපුරය නගරයේ සිට තලාව මාර්ගයේ ශ්‍රාවස්තිපුර හන්දිය දක්වා ගමන් ගෙන වම් දෙසින් පිහිටි පාරට හැරී නච්චාදුව නගරය දක්වා ගමන් ගෙන දකුණු පසින් පිහිටි තැපැල් කාර්යාලය පාරේ ටී හන්දිය දක්වා ගමන් කරන්න. මෙහිදී වමට හැරී විද්‍යාල පාරට ඇතුළු වී එම පාරේ ගමන් ගත් විට හමුවන වමට පිහිටි 1 වැනි පාරට හැරෙන්න. මෙම පාරේ මීටර් 50ක් පමණ ගිය විට පාරේ දකුණු දෙසින් අදාල දේපල පිහිටා තිබේ.

2009 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙ. ව.11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වන දින රජයේ ගැසට් පත්‍රය ද, 2009.09.17 වන දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-538

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.- අනුරාධපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු දේපලක් අනුරාධපුර නුවරගම් කෝරළේ මධ්‍යම නුවරගම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සවැව පිහිටි තිසා වැව මුකලාන නමැති ඉඩමේ (පන්ඩුලගම නිවාස සංකීර්ණය) බෙදා වෙන් කළ ලොට් 223 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ.ඉඩමේ ප්‍රමාණය පර්චස් 28.7

මෙම දේපළ, හෙට්ටිආරච්චිලාගේ ප්‍රදීප් වජිර රණසිංහ සහ මහගම කංකානම්ලාගේ ගීතානි ජයලත් යන අය බන්ධනදායින් ලෙස හැටන්

නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම* .- අනුරාධපුරය නගරයේ සිට පුත්තලම පාරේ යුද හමුදා කඳවුර පිහිටි පන්වුලගම හන්දිය දක්වා පැමිණ දකුණට ඇති පාරට පිවිස පන්වුලගම නිවාස සංකීර්ණය දක්වා ගමන් ගත් විට මෙම සංකීර්ණයේ අංක 41 දරන අදාල දේපල වේ.

2009 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින ප.ව.2.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.18 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නः නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-537

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මොණරාගල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගොඩිගමුව ගමේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩී. හෙට්ටිගේ සාදන ලද 1991.06.21 වන දින අංක 2647 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි හේනේගෙදර පටුමගේ වරිපනම් අංක 22/4 දරන දේපල ඇතුලු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 12.

මහරගම හන්දියේ සිට දෙහිවල පාරට හැරෙන්න. මෙම පාරේ මීටර් 325ක් පමණ ගමන් ගෙන වමට හැරී පිළියන්දල පාරේ මීටර් 625ක් පමණ පැමිණ නීලම්මහර පාරට හැරෙන්න. මෙම පාරේ කි. මී. 1.45ක් පමණ ගමන් ගෙන හේනේ ගෙදර පාරට ඇතුළු වී මීටර් 175ක් පමණ ගිය පසු දකුණට පිහිටි බොරළු පාරේ මීටර් 75ක් පමණ ගිය විට අදාල දේපල මෙම පාරට මායිම්ව වම් පැත්තේ පිහිටා තිබේ.

මෙම දේපළ, පුංචිහේවගේ බෙනට් සිල්වා ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2009 ක් වූ නොවැම්බර් මස 06 වැනි දින ප.ව.3.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.08.28 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නः නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661821.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-536

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අනුරාධපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වගාවට/පදිංචියට සුදුසු දේපලක් මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටුකැලියාව ගමේ පිහිටි රජයේ ඉඩමට බලයලත් මානක

ජේ. ටී. ගලගෙදර විසින් මැන සාදන ලද 2008.01.25 වැනි දින අංක 2019 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ඇතුළු අනිකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් 03.

මෙම දේපළ ඉබ්‍රාහිම් සුරබ්දීන් සහ සරීෆ්ඩීන්ගේ පවුසුල් ජනෆ්ඩීන් යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම* :- අනුරාධපුරය නගරයේ සිට කහටගස්දිගිලිය පාරේ සිප්පුකුලම දක්වා පැමිණ දකුණට හමුවන ගලෙන්බිඳුණුවැව පාරට හැරෙන්න. මෙම පාරේ උපුල්දෙනිය හරස් පාර හන්දිය දක්වා ගමන් ගෙන දකුණු දෙසට පිහිටි පාරට ඇතුළු වී කිලෝමීටර් 2ක් පමණ කටුකැලියාව ගම දක්වා ගිය විට මෙම පාරේ වම් දෙසින් අදාල දේපල පිහිටා තිබේ.

2009 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙ.ව.10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.17 වන දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අය කිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-532

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.-කඳාන ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එම්. එන්. පෙරේරා විසින් 2005.05.20 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 120 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එදිරිසූරිය මොහොට්ටිගේ විජිත ද සේරම් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් අයකර ගැනීම සඳහා

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇත්තාවූ දේපල වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 03 වැනි දින පෙ.ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.28 දින *ගැසට් පත්‍රයේ* සහ 2009.09.02 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දැන් ගම්පහ දිස්ත්‍රික්කයේ), අළුත්කුරු කෝරළේ, රාගම්පත්තුවේ, රාගම පිහිටි දෙල්ගහවත්ත සියඹලාගහවත්ත සහ කහකොටුව නැමති ඉඩමට බලයලත් මානක චන්ද්‍රා සෙනවිරත්න විසින් 2005.04.04 වන දින මැන සාදන ලද අංක 1669 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද කැබිලි අංක ඒ ලෙස ලකුණු කරන ලද කොටස.

ප්‍රමාණය පර්චස් විස්සයි (අක්කර 0, රූඩ් 0, පර්චස් 20)

*දේපලට පිවිසීම* .- කඳාන නගරයේ සිට ගම්පහ - ගනේමුල්ල ප්‍රධාන මාර්ගයේ කි. මී. එකක් පමණ ගමන් කිරීමේදී හමුවන දකුණට ඇති වාසනා ක්‍රීඩාපිටිය පාරේ මීටර් 600ක් ගමන් කොට නැවත වමට හැරී මීටර් 50ක් පමණ ගමන් කිරීමේදී දකුණු පැත්තේ නො. 28/24 ට යාබදව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියළුම ප්‍රචාරක ගාස්තු,
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2664664 න් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථනය : 071 - 4175944.

10-608

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - වත්තල ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ )

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔළුව විසින් 2006.05.25 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී නමට ලියා සහතික කරන ලද අංක 1656 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී ඒ. කේ. අදිකාරි විසින් 2008.02.22 වැනි දින ලියා සහතික කරන ලද අංක 186 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුනායගම් ඇන්තනීසාමී බන්ධනදායි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පිළිවෙලින් මෙහි පහත 1 වැනි සහ 2 වැනි උපලේඛනයන්හි විස්තර කර ඇත්තාවූ දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 04 වැනි දින පෙ. ව. 11.00 ට සහ ප. ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී පිළිවෙලින් මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.07.17 දින ගැසට් පත්‍රයේ සහ 2009.09.15 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

### 1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බල ප්‍රදේශය තුළ) අළුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල පරණ මීගමුව පාරේ වරිපනම් අංක 30/1 ඒ හි ගෝනාකෝවිලේවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. ආර්. සමරසිංහ විසින් 2006.02.01 වැනි දින සහ අංක 4669 දරන පිඹුරෙහි ලොට් අංක 1 දරන කොටස.

ප්‍රමාණය පර්චස් දෙකයි දශම හතයි තුනක් (අ. 0 රූ. 0 පර්. 2.73)

### 2 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බල ප්‍රදේශය තුළ) අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල ලාවළුගහකුඹුර සහ ලාවළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. සමරවික්‍රම විසින් මැන සාදන ලද 1986.09.14 දින සහ අංක 106/1986 දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටස.

ප්‍රමාණය පර්චස් දහහතක් (අ. 0 රූ. 0 පර්. 17)

දේපළට පිවිසීම.˚ කොළඹ˚ මීගමුව ප්‍රධාන මාර්ගයේ ගමන් කිරීමේ දී හමුවන පරණ මීගමුව හන්දියේ සිට දම්වැල් 1 1/2 පමණ දුරින් (වරිපනම් අංක 30/1 ඒ 34/6 සහ 34/7 පරණ මීගමුව පාර වත්තල) මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

(i) ගැණුම් මිළෙන් සියයට දහයක් (10%) ක්,
(ii) ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
(iii) සියලුම ප්‍රචාරක වියදම්,
(iv) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිළෙන් 2.5%),
(v) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
(vi) ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනුවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී එල් සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමණාකරු (ණය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක : 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2664664 න් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944.

10-611

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - අම්බලන්තොට ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක ඊ. එම්. ප්‍රේමසිරි විසින් 1992 දෙසැම්බර් මස 23 වැනි දින සාදන ලද අංක 92/156 ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුවේ, නරවල්පිට පිහිටි ඉදිගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් 1 දරන, රූඩ් තුනයි පර්චස් දාහතරයි දශම පහක් (අ. 0 රූ. 3 පර්. 14.5) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේත් සමග වේ.

රත්න සෝ මිල්ස් යන නාමය හා විලාශය යටතේ ඒක පුද්ගල වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පල්ලෙගේ නාමල් කුලරත්න ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2009 නොවැම්බර් මස 06 වැනි දින ප.ව. 1.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.04.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.10.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.10.16 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* හක්මණ සිට ඇල්ලවැල්ල පාරේ නරවැල්පිට උතුර මංසන්ධිය දක්වා ගොස් දකුණට ඇති දෙනගම වැව පාරේ මීටර් 300 ක් පමණ ගොස් වම් පසින් ඇති වාහන ගමනාගමනයෙන් යුත් වැලිපොත ගුරු පාර ඔස්සේ මීටර් 700 ක් පමණ ගොස් හැරිය යුතු අතර, මෙම පාරේ වම් පසින් ආරක්ෂක නිලධාරීන් යොදා ඇත. නරවැල්පිට උතුර මංසන්ධියට හෝ උතුර හංදියට කි. මී. 1 ක පමණ දුර ප්‍රමාණයක් ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

(i) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(ii) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
(iii) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
(iv) නොතාරිස් ගාස්තු රු. 2000 ,
(v) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
(vi) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
(vii) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ අම්බලන්ගොඩ ශාඛාවේ තැන්පත් කල යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්,

අංක : 99,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011-2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක : 129, තිස්ස පාර,
අම්බලන්තොට.
දුරකථන අංක : 047 - 2223816.
ෆැක්ස් අංකය : 047-2223817.

10-485

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අළුත්ගම ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් 2005.03.15 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී නමට ලියා සහතික කරන ලද අංක 1236 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ධර්මකීර්ති උපුල් නිශ්ශංක පෙරේරා යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් , එකී ණය මුදල් සහ ඒ මත අය විය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනිම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2009ක් වූ නොවැම්බර් මස 06 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණ මග්ගොන බැද්දේ ප්‍රාදේශීය සභා සීමාවේ බේරුවල උප ප්‍රාදේශීය සභාව සීමාව තුළ පයාගල මග්ගොන බැද්දේ මග්ගොන බටහිර ගාලු පාරේ වරිපනම් අංක 470 පුංචිපල්ලියවත්ත නොහොත් කුඩාපල්ලියවත්ත (කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක කේ කන්නන්ගර විසින් මැන සාදන ලද 2004.07.71 වැනි දින සහ අංක 827/2004 දරන පිඹුරේ බෙදා වෙන්කරන ලද ලොට් අංක 2 සී දරන කොටස.

ප්‍රමාණය : පර්චස් දහහතරක් (අ. 0 රූ. 0 පර්. 14)

*පිවිසීම .-* කළුතර නගරයේ සිට ගාලු පාරේ මග්ගොන නගරය දක්වා ප්‍රධාන මාර්ගයේ ගමන් කොට දකුණට ඇති අඩි 15 ක් පමණ පාරේ මීටර් 25 ක් පමණ ගමන් කිරීමේ දී වමට වන්නට (මග්ගොන මහජන බැංකු ශාඛාව පිටුපස මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.08.25 වැනි දින ද අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

(i) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
(ii) ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
(iii) සියළුම ප්‍රචාරක ගාස්තු,
(iv) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
(v) මුද්දර ගාස්තු,
(vi) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
(vii) ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංකය : 071 - 4175944.

10-607

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

ජී. ඒ. එම්. චන්ද්‍රිකා
ගිණුම් අංක : 0030 5001 6365.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2006 දෙසැම්බර් 21 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හය ලක්ෂ අනූතුන් දහස් අටසිය දහහතරයි ශත අනූදෙකක (රු.693,814.92) ක මුදල ද 2006 සැප්තැම්බර් 09 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය ලක්ෂ පනස් එක් දහස් පන්සිය දොළහයි ශත අසූඑකක (රු.651,512.81) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළියද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේනොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2007.07.13 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2007.06.22 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2009.11.09 පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, ඕතර පළාත, කැබැල්ලවිටගම ග්‍රාමයේ පිහිටි "දිවුලගහ කුඹුර" දැන් හයිලැන්ඩ් කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2004 පෙබරවාරි 14 දාතම හා අංක 5282 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ප්‍රාදේශීය සභා පාර නැගෙනහිරට : පිඹුරු අංක 4589 හි ලොට් 1, 2 (පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් 3 දකුණට : පිඹුරු අංක 5282 හි ලොට් 3 සහ බස්නාහිරට : පිඹුරු අංක 5282 හි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිහයක් (A0, R0, P26) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන්ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග වෙළුම/පත්ඉරුව ඊ 106/285 හි මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 4589 හි නිරූපිත ලොට් 2 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-586/3

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

ආර්. එම්. එස්. එච්. රත්නායක සහ කේ. පී. එන් එස්. පෙරේරා
ගිණුම් අංක : 1019 5303 4205.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 මැයි 08 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිහතර ලක්ෂ හතලිස් හතර දහස් හාරසීය විසිඑකයි ශත අටක (රු.2,444,421.08) මුදලද 2008 පෙබරවාරි 18 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි දෙලක්ෂ හතලිස් හය දහස් හාරසීය පනස් එකයි ශත අසූ අටක (රු.2,246,451.88) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළියද, ප්‍රචාරණ වියදම්ද,

දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009 අගෝස්තු 28 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009 අගෝස්තු 19 දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2009 නොවැම්බර් මස 05 දින ප.ව. 3.30 ට ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවත් තුළ (කැස්බෑව උප කාර්යාලය) මාවිත්තර පිහිටි "කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. ගුණසේකර යන අය විසින් සාදන ලද (1997 ජනවාරි 21 දාතම දරන ඔප්පුව පරිදි) 1997 ජනවාරි 18 දාතම හා අංක 6699 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 2බී 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ කොටසක්, පිඹුරු අංක 2163 හි ලොට් 1 නැගෙනහිරට : පිඹුරු අංක 2163 හි ලොට් 4 දකුණට : ලොට් 2බී2 සහ 2සී සහ බස්නාහිරට : පිඹුරු අංක 5392 හි ලොට් 2 ඒ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශතාවයන්ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග පිඹුරු අංක 6699 ට අනුව වෙළුම/පත්ඉරුව එම් 2844/97 හි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එච්. එල්. ගුණසේකර විසින් සාදන ලද 1994 දෙසැම්බර් 18 දාතම හා අංක 5392 පිඹුරේ ලොට් 2සී (පාර සඳහා වෙන්කිරීම) මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-586/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

යූ. වී. ඩී. එඩ්වඩ් සහ ජී. ඒ. එස්. එස්. පෙරේරා
ගිණුම් අංක : 1005 5051 9350

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 මාර්තු මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහතුන් ලක්ෂ හතලිස් පන්දහස් හත්සිය පනස් හතරයි ශත හැත්තෑ හතක (රු. 1,345,754.77) මුදලද 2007 සැප්තැම්බර් මස 19 දින සිට අයවිය යුතු මුළු මුදල ද පියවනු ලබන දිනය තෙක්, රුපියල් දොළොස් ලක්ෂ අසූදෙදහස් දෙසිය අසූ හතරයි ශත විසිපහක (රු. 1,282,284.25) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.06.12 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2009.05.30 දින "දිණමින" "ඩේලිනිව්ස්" සහ "තිනකරන්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2009 නොවැම්බර් මස 06 දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවත් තුළ දෙල්ගොඩ ග්‍රාමයේ පිහිටි එක්සත් මාවත 1 පටුමගේ වරිපනම් අංක 17/09, දරන 'සියඹලාගහවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1997 ජූලි 03 දාතම හා අංක 408/1997 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ඒ. ඊ. කැරලයින් නෝනාගේ ඉඩම සහ ලොට් 2 නැගෙනහිරට : එල්. බී. ලීටි නෝනාගේ සහ එල්. බී. ප්‍රේමවතීගේ ඉඩම් දකුණට : ඒ. ඩබ්ලිව්. ජේන් නෝනාගේ ඉඩම සහ බස්නාහිරට : (ලොට් සී) පාර සහ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහනමයක් (අ. 0 රූ. 0 පර්. 19) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශතාවයන්ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 408/1997 ට අනුව වෙළුම/පත්ඉරුව සී 748/175 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 408/1997 පිඹුරේ නිරූපිත මාර්ගය මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-586/2

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී- වැල්ලවාය ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2006.11.23 දින සහ අංක 14505 දරන බැඳුම්කරය සහ රත්නපුර ප්‍රසිද්ධ

නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දාවූද 2007.12.31 වැනි දින සහ අංක 348 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇහැලියගොඩ තලවිටියෙහි සී.ස. ලෙෂර් ලංකා (පුද්) හි යද්දෙහිගේ වෙන්සන් ද සිල්වා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් හා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී 2009 ක් වූ නොවැම්බර් මස 3 වැනි දින පෙ.ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වැනි දේපල .-*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ උඩපත්තුවේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල ඇහැලියගොඩ දඩුවත්ත අරලිය උයනෙහි පිහිටි බංගලාවත්ත හෙවත් ඉස්තාලෙවත්ත නමැති ඉඩමේ ලොට් එක්ස් ප්‍රමාණය රූඩ් 1, පර්. 14

*2 වැනි දේපල .-*

ඉහත කී බංගලාවත්ත හෙවත් ඉස්තාලෙවත්ත නමැති ඉඩමේ ලොට් A ප්‍රමාණය රූඩ් 1, පර්. 5.00

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.09.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.09.23 වැනි දින දිවයින, ද අයිලන්ඩ්, සහ තිනකරන් පුවතපත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයේ ඇහැලියගොඩ පසුකොට කි. මී. 74 සහ 75 කණු අතර, රෝයල් සෙරමික් පිඟන් ගඩොල් කර්මාන්ත ශාලාව දෙසට යන පාරේ මීටර් 150 ක් ගිය විට වම් අත පැත්තට ඇති අරලිය උයන පාරේ කෙළවරේ 1 සහ 2 දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-*වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%) ක්ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10, (දුරකථන අංකය 2661826, 2661817) වෙතින් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, ගින් ක්යෝකුෂින්,
කටුවාවල පාර,
බොරලැස්ගමුව.
දුරකථන අංක : 0112-509442, 0777 - 378441, 071-44424478
ෆැක්ස් අංකය : 0114-617059

10-526

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කටුනායක ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුන රැස්වීමේ දී සම්මත කර ගන්නා යෝජනා සම්මුතිය ප්‍රකාරව කච්චකඩුගේ උදය ප්‍රියන්ත කුමාර ප්‍රනාන්දු ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇති පහත විස්තර වන දේපළ එම දේපල පිහිටි ස්ථානයන්හිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වැනි විකිණීම .-* 2009 නොවැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.00 ට

*දේපළ විස්තර.-* පමුණුගම පුල්ලුහේන ගමේ පිහිටි මාදන්ගහවත්ත නොහොත් ඉස්කෝලවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ජේ. ඩී. සිල්වා විසින් සාදන ලද 1995.06.04 වැනි දින අංක 4873 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් අංක ඒ දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 23.80 කි.

*දේපලට පිවිසීම :-* කොළඹ සිට මීගමුව පාරේ තුඩැල්ල හන්දිය දක්වා පැමිණ බෝපිටිය පාරට හැරී බෝපිටිය හන්දිය දක්වා ගමන් ගෙන වම් දෙසට හැරී කොළඹ පාරට පිවිස කි. මී. 01ක් පමණ ගිය විට මෙම පාරේ දකුණු දෙසින් Niranjan Centre Tech Sri Lanka නමැති ආයතනය පිහිටා ඇති දේපල වේ.

*2 වැනි විකිණීම.-* 2009 නොවැම්බර් මස 07 වැනි දින පෙ. ව.11.30 ට.

*දේපළ විස්තර.-* කටුනායක - සීදූව නගර සභා සීමාවන් තුළ පිහිටි බබාගුරුවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986.11.24 වැනි දින අංක 2776 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් අංක 21 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 14.6කි.

දේපළට පිවිසීම. - කොළඹ මීගමුව පාරේ සීදූව ලියනගහමුල්ල ග්ලෝබල් පාර්ක් දක්වා පැමිණ මෙහිදී දකුණට හැරී එච්. පී. ටී. නිවාස පිහිටි පාර ඔස්සේ මීටර් 75ක් පමණ ගිය පසු අදාල දේපල පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.08.07 වැනි දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ :-

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය විසින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.

වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815, 011-2661816.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974,
ෆැක්ස් අංකය : 081-2211025.

10-530

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**
**(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ නාගරික කොට්ඨාස අංක 8 බටහිර කොටහේනේ එපිට ජම්පටා වීදියේ ජම්පටා පටුමගේ පිහිටි ජම්පටා වීදියේ අංක 79 ට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් මැන සාදන ලද අංක 9223 ඒ සහ 2000 ඔක්තෝබර් මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් XI දරන බෙදා වෙන් කළ බිම් කොටස (සහ ඊට අයත් ගහකොළ පළතුරු සහ සෑම සියලු දේත් සමගය)

ප්‍රමාණය අ. 0 රූ. 1 පර්. 26 හෝ (හෙක්ටයාර් 0.16690)

ඉහත සඳහන් බිම් කොටසට බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් මැන සාදන ලද අංක 9223 ඒ සහ 2000 ඔක්තෝබර් මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් සී මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද්දාවූ ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) නමට ලියන ලද්දාවූ ද අංක 789 සහ වර්ෂ 2007.09.24 වැනි දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 12, වෙල්ල වීදියේ අංක 51, දරන ස්ථානයේ 'විමාකේ' යන නාමය විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් කොළඹ 11, සහ පිපල්ස් පාක් සාප්පු සංකීර්ණයේ අංක 180-1/8, දරන ස්ථානයේ වෙන්කේ ඉම්පෙක්ස් යන නාම විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මාර්කණ්ඩු ගිරිදරන් සහ කලාරෝහිණී ගිරිදරන් යන අය විසින් ගෙවීම් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009ක් වූ නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 10.00 ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.09.14 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ඉදිරියට ගමන් කර එන්. එච්. එම්. අබ්දුල් කාදර් පාරේ ගමන් කර සී බීච් පාරේ සෙන්ට් ඇන්තනීස් මාවත ඔස්සේ ඉදිරියට ගමන් කර සෙන් ඇන්තනීස් පල්ලිය වෙතට ගමන් කර එතැනින් දකුණට ඇති ජම්පටා වීදියේ මීටර් 150 පමණ ඉදිරියට ගමන් කර වමට ඇති ජම්පටා පටුමගේ තවත් මීටර් 75ක් පමණ ගමන් කර (සිවන් කෝවිල පසු කර) දකුණට ඇති අඩි පාරේ ඉදිරියට ගමන් කළ විට අදාල දේපල හමුවේ.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි. : -

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු- නීති, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංක 011- 4313158.

ත්‍රිවංක සහ සේනානායක,
වෙන්දේසිකරුවෝ, බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකුව.

අංක 182, තෙවන මහල, හල්ස්ඩ්‍රොප් වීදිය, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2388318.

10-633

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මරදාන ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

(මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 866 සහ 2003.06.22 දින දරන ණය බැඳුම්කරය මත හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 3107 සහ 2008.02.19 දින දරන ණය බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම බේස් එන්ටර්ටේයින්මන්ට්ස් (පුද්ගලික) සමාගම වෙනුවෙන් රත්නායක මුදියන්සේලාගේ ගුණතිලක ප්‍රදීප් ලංකා රත්නායක යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 07 වන දින ප.ව. 2.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, ඕතර පළාතේ, දංකොටුවට ඕතර දකුණු උප කාර්යාල හි මොරොක්කුලිය පිහිටි ලංසියාවත්ත සහ අලුත්ගෙඩද වත්ත නමැති ඉඩම් කොටසට බලයලත් මානක වයි. එම්. ආර්. යාපා විසින් මැන සාදන ලද අංක 406 සහ 1989.05.01 දින දරන පිඹුර සහ බලයලත් මානක වයි. එම්. ආර්. යාපා විසින් එකී අංක 406 දරන පිඹුරේ 2004.06.10 දින ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 දරන ඉඩම් කොටස විශාලත්වය : අක්කර එකයි රූඩ් දෙකයි (අ. 1, රූ. 2, පර්. 0)

වැඩි දුර විස්තර සඳහා.-2009.08.28 වන දින *රජයේ ගැසට් පත්‍ර* හා 2009.08.31 වන දින ද අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම.- කොළඹ පුත්තම පාරේ පැමිණෙන විට හමුවන තෝප්පුව හංදියෙන් දකුණට ඇති නාත්තන්ඩිය පාරේ කි. මී. 2 ක් පමණ පැමිණි පසු දකුණු පසින් හමුවන මැටිකොටුව පාරේ කි. මී. 2 ක් පමන ඉදිරියට පැමිණෙන විට පාරේ දකුණු පසින් හමුවන අඩි 15 ක් පළල පාරට පිවිස තවත් මීටර් 150 ක් පමණ ඉදිරියට පැමිණෙන විට මාර්ගය අවසානයේ දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10% ක මුදලක්ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදලද,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදලද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද,

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු අදාල ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2664664

ශ්‍රියාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්,
දුරකථන අංක : 011-2320074 හෝ 0713-151356

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

10-617

---

**ඩී එෆ් සී සී බැංකුව**
වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 221 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවට අයත්, කුරණ 2 වන කොට්ඨාසයේ පිහිටි, අංක 732 සහ 740 කොළඹ පාර යන ලිපිනය දරන, සියඹලාගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද අංක 3329 හා 2007 ඔක්තෝබර් මස 11 දින දරන පිඹුරේ දැක්වෙන, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය. ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 01, පර්. 16.20 හෙවත් හෙක්ටයාර 0.1421 එහි පිහිටි සියල්ල සහිතව. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඒ. වී. විජේකෝන් විසින් සහතික කරන ලද, 2007 ඔක්තෝබර් මස 23 වන දිනැති අංක 221 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නීතිගත වූද සමාගම් අංක PV60021 ද දරන සහ ලියාපදිංචි කාර්යාලය මීගමුව පිහිටි ශාන්තා ආනා මිනරල්ස් (පුද්ගලික) සමාගම (මින්මතු සමාගම ලෙස හැඳින්වෙන) සහ නන්ගල්ලගේ ටෙරන්ස් ඉමැනුවෙල් ක්‍රිස්ටි ප්‍රනාන්දු යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලයල යටතේ අප විසින් 2009 නොවැම්බර් මස 05 වන දින (බ්‍රහස්පතින්දා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,

3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැනුම් මිලෙන් 2 1/2%ක (සියයට දෙකහමාර),
4. රු. 33,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම
රජයේ අනුමැතිය ලත් සියවසකට අධික කලක්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංකය : 081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරයඃ*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන ෆැක්ස් අංකය : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

10-553

---

**ඩී.එෆ්.සී.සී. බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 22852 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහපත්තුවේ, පස්යාල ග්‍රාමයේ පිහිටි "මැදලන්දවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 1510 හා 2004.03.27 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය පර්චස් දහයක (අ. 0, රූ, 0, පර්. 10) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි, සහ වෙනත් සියළු දේ.

ඉහත කී බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, පස්යාල ග්‍රාමයේ පිහිටි "මැදලන්ද වත්ත" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 1510 හා 2004.03.27 දින දරන පිඹුරේ ලොට් අංක 10 ලෙස ලකුණු කල බෙදා වෙන් කල බිම් කට්ටිය පර්චස් එකොළහකුත් දශම හතක් (අ. 0, රූ. 0. පර්. 11.7) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ වෙනත් සියළු දේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 22852 හා 2005.07.07 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූද ලියාපදිංචි කාර්යාලය ගම්පහ පිහිටා ඇත්තාවූ ද සමාගමක් වන ලියාපදිංචි අංක N(PVS) 40089 දරන (මෙහි මින් ඉදිරියට "සමාගම" යනුවෙන් සඳහන් කරන) "එවර්ග්‍රීන් හෝම්ස් ඇන්ඩ් එන්වෙස්ට්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගම විසින් සහ හේරත් මුදියන්සේලාගේ කපිල බණ්ඩාර අමරසිංහ යන අය විසින් ඩී.එෆ්.සී.සී. බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම් වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපල ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් මා වෙත පවරන ලද බලතල යටතේ මා විසින් 2009 නොවැම්බර් මස 17 වන දින පෙරවරු 11.30 ට ආරම්භ කර එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.-මිටිය පහත හෙලා මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් (සියයට එකක්) වන පළාත් පාලන අයබදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක් (සියයට දෙකයි දශම පහයි)
4. නොතාරිස් ගාස්තු වශයෙන් රුපියල් 2000 ක්
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රුපියල් 500
6. සියළුම ප්‍රචාරක වියදම්

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් බලධාරීන් විසින් නියෝග කරන ලද ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011- 2442442.

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථනය : 011-3068185
2572940
ෆැක්ස් අංකය : 2572940

10-567

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

ඩබ්ලිව්. වී. ප්‍රනාන්දු සහ එම්. කේ. එම්. එල්. ප්‍රනාන්දු

ගිණුම් අංක : 1030 5006 8807

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබීඇති බලතල ප්‍රකාර 2006 ක් වූ ඔක්තෝබර් මස 26 දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය අනුව රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හත් දහස් අටසිය හැත්තෑ දෙකයි ශත පනස් හතක (රු.1,247,872.57) මුදලද 2006 අගෝස්තු මස 02 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එකොළොස් ලක්ෂ තිස් තුන් දහස් එකසිය තිස් හතරක (රු.1,133,134) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2007 පෙබරවාරි මස 09 දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2007 ජනවාරි මස 29 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2009 නොවැම්බර් 12 දින ප.ව. 2.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ මුන්නේෂ්වරම් පත්තුවේ, උතුරු පිටිගල් කෝරළේ ඉනිගොඩවෙල පිහිටි "කෝන්ගහකොටුව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද 1980 පෙබරවාරි 29 දාතම හා අංක 638/පී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 28 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරු අංක 638/පී හි ලොට් 27 නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 29 දකුණට සහ බස්නාහිරට : ලොට් 99 (මාර්ග වෙන්කිරීම, බස්නාහිරට ලොට් 102 වඩා නිවැරදි නමුත්, (මාර්ග වෙන්කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතක් (A0 R0 P17) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන්ද වෙනත් අයිතීන්ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව සී 179/12 හි හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-586/6

**මහජන බැංකුව(විශේෂ වත්කම් ඒකකය)**

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29දරන මහජන බැංකු පනතෙහි 29D වන වගන්තිය යටතේ විකිණීම

මෙම වෙන්දේසිය මහජන බැංකුවට පක්ෂව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලද නඩු තීන්දු අංක (SPL) LA 60/08 සහ ලිඛිත අභියාචනා අංක 1268/98 මත සිදුවේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ නුවරඑළිය නගර සභා සීමාවට අයත් බදුල්ල පාරේ පිහිටි, (වර්තමානයේ ක්වීන් එලිසබත් ඩ්‍රයිව් ලෙස හැඳින්වෙන) සිංහගිරි ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු S H B ජෝෂප් මහතා විසින් සකසන ලද සහ අංක 136 (කොටසක්), බදුල්ල පාර යන ලිපිනය දරන (වර්තමානයේ ක්වීන් එලිසබත් ඩ්‍රයිව් ලෙස හැඳින්වෙන) 1971 අගෝස්තු මස 17 වන දින දරන සහ අංක 99/71A දරන පිඹුරුපතෙහි ලොට් අංක 02 ලෙස දැක්වෙන බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 0 පර්. 14 එහි පිහිටි සියල්ල සහිතව.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ නුවරඑළිය නගර සභා සීමාවට අයත් ඉහත කී අංක 136 (කොටසක්) බදුල්ල පාරෙහි පිහිටි, සහ ඉහත කී අංක 99/71ඒ දරන පිඹුරුපතෙහි ලොට් 3 සහ 4 ලෙස දැක්වෙන බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය පර්. 28 එහි පිහිටි සියල්ල සහිතව මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය කොට්ඨාසයේ ඔය පළාත කෝරළේ නුවරඑළිය මහ නගර සභා සීමාවට අයත් බදුල්ල පාරෙන් ද පිහිටි (වර්තමානයේ ක්වීන් එලිසබත් ඩ්‍රයිව් ලෙස හැඳින්වෙන සිංහගිරි ලෙස කලින් හැඳින්වූ) අංක 136 (කොටසක්), බදුල්ල පාර, යන ලිපිනය දරන (වර්තමානයේ ක්වීන් එලිසබත් ඩ්‍රයිව් ලෙස හැඳින්වෙන) ඉහත කී අංක 99/71A දරන පිඹුරුපතෙහි ලොට් 05 ලෙස දැක්වෙන බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ්. 0, පර්. 14 එහි පිහිටි සියල්ල සහිතව මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ නුවරඑළිය මහ නගර සභා සීමාවට අයත් ඉහත කී අංක 136 (කොටසක්), බදුල්ල පාරෙහි පිහිටි සහ ඉහත කී අංක 99/71 A දරන පිඹුරුපතෙහි ලොට් 6 සහ 7 ලෙස දැක්වෙන බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 30.25 එහි පිහිටි සියල්ල සහිතව මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2009 නොවැම්බර් මස 07 වෙනි දින (සෙනසුරාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 1997 අගෝස්තු මස 08 වන දින සහ 2009 අගෝස්තු මස 07 වන දින *රජයේ ගැසට් පත්‍රයද* 1997 ජූලි මස 19 වන දින සහ 2009 මැයි මස 07 වන දින දිනමිණ පුවත්පත්ද 1997 ජූලි මස 19 වන දින සහ 2009 මැයි මස 07 වැනි දින ඩෙයිලි නිවුස් පුවත්පත්ද 1997 ජූලි මස 19 වන දින තිනකරන් පුවත්පත ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු යː-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැනුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනූවක්) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 02, සර් චිත්තම්පලම්. ඒ. ගාඩිනර් මාවත අංක 75 හි පිහිටි මහජන බැංකු ප්‍රධාන කාර්යාලයේ (පළමු මහල) විශේෂ වත්කම් ඒකකය සහකාර සාමාන්‍ය අධිකාරී වෙත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා දුරකථන අංක : 2481546, 4714601, 2481382 අමතන්න.

යථෝක්ත ලිපිනයෙන් අදාල ඔප්පු සහ අනිකුත් විස්තර ලබාගත හැකිය. ඉහත සඳහන් කල පරිදි දින 30 ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදල බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ෂොක්මන් සහ සමරවික්‍රම
රජයේ අනුමැතිය ලත් සියවසකට වැඩි කලක්
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර, මහනුවර
දුරකථන අංකය : 081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරයඃ*
අංක 290, හැව්ලොක් පාර, කොළඹ 05,
ටෙලි 011-2502680, 2585408,
දුරකථන අංකය/ෆැක්ස් : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

10-552

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නගර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක - සීදූව සුළු නගර සභා සීමාව තුළ දකුණු කදිරාන ග්‍රාමයේ පිහිටි "දම්බුවේවත්ත" නමැති ඉඩමට/ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසක් වන 1978.10.27 වැනි දින දරන චිත්‍ර සටහනේ දැක්වෙන B II ලෙස ලකුණු කොට ඇති (කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අදියර 1 සැකසුම් පිඹුරේ නිරූපිත චිත්‍ර සැලසුම් අංක GCE/IPZ/K/003 හි) ඉඩම් කොටස හා එහි පිහිටි ගොඩනැගිලි/ඉඩම්වල ඇති සියළුම 99 අවුරුදු බදු අයිතිය (සහ ඊට අදාළ මාර්ග අයිතියද) ප්‍රමාණයෙන් අක්කර 07 ක ඉඩම ඉහත සඳහන් පරිශ්‍රය තුළ සහ මත තබා ඇති මෙහි පහත සඳහන් පිරියත (යන්ත්‍රාගාර) යන්ත්‍රසූත්‍ර හා උපකරණ හා ඒ හා සමාන දේ ඇතුළුව

**දෙවන උපලේඛනය**

පළමුවන උපලේඛනයේ සඳහන් පරිශ්‍රය තුළ සහ මත තබා තිබෙන මෙහි පහත සඳහන් පිරියත (යන්ත්‍රාගාර) යන්ත්‍රසූත්‍ර හා උපකරණ හා ඒ සමාන දේ ඇතුළුව එනම්

**රබර් පිරිසැකසුම් යන්ත්‍රාගාරය**

| | | |
|---|---|---|
| ෆැරල් කේ 9 බැන්බරි මික්සර් | 30 කැලැන්ඩරය | බෆං මැෂින් |
| ෆැරල් 84 මෝල | 18 කැලැන්ඩරය | සිමෙන්ට් මික්සර් |
| ෆැරල් 60 මෝල | හයිඩ්‍රොලික් ප්‍රෙස් 11 | ලේටැක්ස් මික්සර් |
| ෆැරල් 36 ක්‍රැකර් මෝල | ස්පොන්ජ් ප්‍රෙස් | බෝල් මිල් |
| 60 වයින්ඩ් අප් සහිත කැන්වස් කැලැන්ඩරය | එක්ස්ට්‍රෑඩර් (ගන්ස්ටාර්) | ටොගල් ප්‍රෙස් |
| ලැමිනේටර් යනාදිය | එක්ස්ට්‍රෑඩර් (මොඩර්න්) | බැරල් එලිවේටර් |
| 60 සොන්ගෝ කැලැන්ඩරය | සෝල්කටිං මැෂින් | ස්ටීල් ප්ලැට්ෆෝම් (බැන්බරි) |
| | බේල් කටර් | පවුඩර් බොක්ස් |

**කැපුම් අංශය**

| | |
|---|---|
| ඩබල් ආම් ක්ලිකර් | 05 |
| ඇටම් ක්ලිකර් සිංගල් ආම් | 06 |
| රියල් ස්ලයිසිං මැෂින් | |
| පී. වී. සී. ස්ට්‍රැප් කටිං මැෂින් | |
| බයස් කටිං මැෂින් | |

**පාවහන් එකලස් කිරීමේ අංශය**

| | |
|---|---|
| ෆැක්සිං ප්‍රෙස් | 06 |
| ඉන්සෝල් සිමෙන්ටිං මැෂින් | 06 |
| ෆිටිං ලයින්ස් | 02 |
| වෝල්කනයිසර් | 03 |
| බෆිං මැෂින් | 06 |
| පැකිං කන්වේයර් | 02 |
| ලස්ටිං කන්වේයර් | 02 |
| ස්ට්‍රැපිං මැෂින් | 06 |

**උපයෝජක**

| | |
|---|---|
| කොන්ටිනේන්ටල් බොයිල්ඩර් | |
| ඩික්සන් බොයිල්ඩර් | 01 |
| සීජිආර් බොයිලර් | 01 |
| ගැලුම් 50,000 ඉන්ධන ටැංකිය | |
| එයාර් කම්ප්‍රෙසර | 03 |
| කූලිං ටවර්ස් | 03 |

**සහායක උපකරණ සහ අමතර කොටස්**

| | |
|---|---|
| ෆැලැට්ෆෝම් ස්කේල්ස් | 03 |
| ස්කෙල්ස් - ෆෑන් ටයිප් | 05 |
| පීවීසී ආමර්ඩ් කේබල් | |
| 120Mn, 185Mn, 1.5Mn රෝල් 3 යි | |
| බැටරි චාජර් | |

**මැහුම් අංශය**

| | |
|---|---|
| ඩුප්ලෙක්ස් අයිලටිං මැෂින් | 05 |
| සිම්පල්ස් අයිලටිං මැෂින් | 05 |
| අයිලටිං හෝල් පන්චිං මැෂින් | 03 |
| තායිවාන් අයිලටිං මැෂින් | 04 |

**රසායනාගාරය**

| | |
|---|---|
| ෆැලක්සොමිටරය | 02 |
| හයිඩ්‍රොලික් ප්‍රෙස් | |
| එක්ස්ටෲඩර් | |
| ආබර් ප්‍රෙස් | |
| මූනි විස්කොමීටරය | |
| මික්සිං මිල් | |

**කම්හල**

| | |
|---|---|
| 24" ලේත් | පෙන්ටොග්‍රෆ් |
| 17" ලේත් | සර්ෆස් ග්‍රයින්ඩර් |
| ටෲ ප්‍රෙස් | වර්ටිකල් ඩ්‍රිල් |
| මිලිං මැෂින් | බෑන්ඩ් සෝ |
| වර්ටිකල් මිලිං | නයිෆ් බෙන්ඩිං මැෂින් |
| ස්ප්‍රිං ෆීල්ඩ් ෂේපර් | |

සහ මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර තිබෙන ඉඩමේ පිහිටා තිබෙන ගොඩනැගිල්ලට සහ/හෝ නිර්මාණවලට සවිකර තිබෙන, කවර හෝ විස්තරයකට අයත්, ඉහත දැක්වුණු අයිතිමයන්ට අදාල උපාංග

**තුන්වන උපලේඛනය**

මෙහි පහත දැක්වෙන සියලු හා එක් එක් පිරියත යන්ත්‍රසූත්‍ර හා උපකරණ, මෙවලම්, උපයෝජන ද්‍රව්‍ය උපාංග අමතර කොටස් හා ඒ හා සමාන දේ ඇතුළුව එනම් :-

**කැපුම් අංශය**

| | |
|---|---|
| ස්කිවිං මැෂින් | 07 |

**මැහුම් අංශය**

| | |
|---|---|
| සිංගල් නීඩ්ල් චේන් ස්ටිච් මැෂින් | 04 |
| සිංගල් නීඩ්ල් ලොක් ස්ටිච් මැෂින් | 69 |
| ඩබල් නීඩ්ල් ලොක් ස්ටිච් මැෂින් | 34 |
| සිංගල් නීඩ්ල් සිලින්ඩර් බෙඩ් මැෂින් | 26 |
| සිග් සැග් මැෂින් | 09 |
| ජුකි බාර් ටැකර් | 04 |
| සගිට්ටා තර්මෝ ෆෝල්ඩර් | |
| පොන්ඩර්ස් | 02 |
| ෆෝල්ඩිං මැෂින් | 02 |
| එච්. එෆ්. වෙල්ඩිං මැෂින් | 02 |

**රසායනාගාරය**

| |
|---|
| අවන් |
| ඇබරේෂන් ටෙස්ටර් |
| ටෙන්සිල් ටෙස්ටර් |
| වොෂින් මැෂින් |
| වොෂින් මැෂින් |

**කම්හල**

| |
|---|
| ආක් වෙල්ඩිං කිට් |
| ගෑස් වෙල්ඩිං සෙට් |
| ෆෝක් ලිෆ්ට් ට්‍රක් |

**උපකාරක උපකරණ හා අමතර කොටස්**

| | |
|---|---|
| ලී මේස | 18 |
| වානේ පුටු (කම්කරු) | 225 |
| වානේ රාක්ක | 12 |
| වානේ මේස | 14 |
| චේම්බර් ට්‍රොලි | 78 |
| ෆොක්සිං ටේප් ට්‍රොලි | 25 |
| සර්විස් ට්‍රොලි | 08 |
| ඇලුමිනියම් ලාස්ට්(Laska) | 18,000 කුට්ටම් |
| ඔක්සිජන් සිලින්ඩර් | 04 |
| ඇසිටිලීන් සිලින්ඩර් | 03 |
| එල්. පී. ගෑස් සිලින්ඩර් | 06 |
| බෙන්ච් වයර් | 01 |
| ජී අයි පයිප්ප | 12 |
| ඒ එල් පයිප්ප | 85 |
| කටිං බෝඩ් | 27 |
| 2 1/2 වැල්ව් | 21 |
| ෆයර් එක්ස්ටිංග්විෂර් | 50 |
| පී. වී. සී වයර් | 05 |

| | |
|---|---|
| 200 ඒ අයිසොලේටර් ස්විච් | |
| ස්ටීම් පයිප්ප | 30 |
| බොයිලර් ටියුබ් | 20 |
| කොපර් බුස්බාර් ලෙන්ත් | 35 |
| 3" ජී අයි පයිප්ප | 16 |
| කෝර් ආමර්ඩ් කේබල් | |
| ඇම්පියර් 400 සෙ. මී. 40 ලෙන්ත් | |
| වානේ අච්චු | 60 |
| ටාටා 1210 ඊ බස්රථය | |

ඇතුළුව මීට අදාළව ඉහත සඳහන් පළමුවන උපලේඛනයේ විස්තර කර තිබෙන පරිශ්‍රය තුළ සහ ඒ මත හෝ ඉහත සඳහන් දිස්ත්‍රික්කය ඇතුළත දැනට හෝ මතු යම් අවස්ථාවක බන්ධනදායී විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන හෝ කරගෙන යනු ලැබිය හැකි යම් පරිශ්‍රයක හෝ මේ බදු ගිවිසුම බලාත්මකව පවත්නා කාලය ඇතුළත ඒෂියා ඉන්ඩස්ට්‍රියල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ චංචල පිරියත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හා බඩු බාහිරාදිය, මින්මතු කලින් කල සහ සෑම කල්හිම ගෙනැවිත් දමා තබනු ලැබිය හැකි යම් පරිශ්‍රයක සහ බන්ධනදායී විසින් මින්මතු කවර හෝ කාලයක හා කලින් කල ඒෂියා ඉන්ඩස්ට්‍රියල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ චංචල පිරියත යන්ත්‍රසූත්‍ර හා උපකරණ ඉවත් කරගෙන යනු ලැබිය හැකි සියලු හෝ යම් ස්ථානවල හෝ ස්ථානයක තිබෙන්නාවූ ද මෙහි මින් ඉදිරියට ඒෂියා ඉන්ඩස්ට්‍රියල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ චංචල පිරියත යන්ත්‍රසූත්‍ර හා උපකරණ යනුවෙන් සඳහන් කරනු ලබන සියලු මෙවලම් සහ උපාංග හා සෑම ආකාරයකම වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍රසූත්‍ර උපකරණ.

**හතරවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (එහෙත් මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) කටුනායක නිදහස් වෙළඳ කලාපයේ 1 වන අදියරේ කර්මාන්තශාලා පරිශ්‍රය තුළ හා මත සහ ගිවිසුම බලාත්මකව පවත්නා කාලය ඇතුළත බන්ධනදායී විසින් දැනට හෝ යම් කාලයක සහ කලින් ඉහත කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය කරගෙන යන නැතහොත් මින් මතු යම්කාලයක හෝ කලින් කල තම කර්මාන්තය හෝ ව්‍යාපාරය ඉවත් කරගෙන ගොස් පවත්වාගෙන යනු ලබන හෝ තම ව්‍යාපාර බඩු තොග උපකරණ හා බඩු බාහිරාදිය සහ වෙනත් චංචල දේපළ බන්ධනදායී විසින් ඉවත් කරගෙන ගොස් තබනු ලැබ වෙනත් ගුදම්, ගබඩා හා පරිශ්‍ර තුළ හා මත තිබෙන්නා වූ සියලු හා එක් එක් ව්‍යාපාරික බඩුතොග, වෙළඳ බඩු බාහිරාදිය සහ දේවල් හා පාවහන් නිෂ්පාදනයේදී ප්‍රයෝජනයට ගන්නා කැන්වස්, ලිනන්, නයිලෝන්, නයිලෙක්ස් ෂීට්ං බයින්ඩිං ක්ලෝත් පේටන්ට් බැට්රියෙල් සුවේඩ්සම් පොලියෙස්ටර්, ගෙතු ටේප්, අයිලට්, නූල්, රබර් සහ රසායන ද්‍රව්‍ය, ලේස් යනාදිය හා පාවහන් ඇසුරුම සඳහා යොදාගන්නා ඇතුළත පෙට්ටි බාහිර තොග පෙට්ටි, ලේබල්, ස්ටිකර්, හැංටැග්, ටිෂු, කඩදාසි ෆාස්ටිනර් සහ පාවහන් රැඳවුම් හා වෙනත් සියලු දේද, සියලු හා එක් එක් ගෘහ භාණ්ඩ සවිකුරු හා වෙනත් සෑම ආකාරයකම සහ සෑම විස්තරයක්ම අයත් අන් සියලු චංචල දේපල යන (බන්ධනදායින් ව්‍යාපාරික බඩු තොග සහ උපකරණ) යනුවෙන් මින් ඉදිරියට සියල්ල හඳුන්වනු ලබන) මේවායින් සංයුක්ත වන, බන්ධනදායිගේ සියලු හා එක් එක් ව්‍යාපාරික බඩු තොග වෙළඳ බඩු වෙනත් බඩු බාහිරාදිය සහ දේ.

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත සඳහන් දේපළ මා විසින් 2009 ක් වූ නොවැම්බර් මස 07 වැනි දින ප.ව. 2.00ට එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත දේපළ ඒෂියා ඉන්ඩස්ට්‍රියල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2009.05.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2009.06.02 වන දින ද අයිලන්ඩ් දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු හා රජය මගින් පනවනු ලබන වෙනත් බදු, වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම්, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජායා මාවත කොළඹ 10.

දුරකථන අංකය : 011-2661821/011-2661815

අයි. ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංකය : 081-2211025, 071-4755974
ෆැක්ස් අංකය : 081-2211025

10-529

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.